වාර්ෂික කාර්යසාධන වාර්තාව

2022

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :- 207

පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	.....	01 - 09
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම		
2.1	විශේෂ ජයග්‍රහන, අභියෝග සහ ඉදිරි ඉලක්ක	.....	10 - 18
2.2	කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග	.....	19 - 21
පරිච්ඡේදය 03 -	වසරේ සමස්ත මුල්‍ය කාර්ය සාධනය		
3.1 – 3.8	මූල්‍ය තත්තවය පිළිබඳ ප්‍රකාශ	.....	22 - 27
3.9	මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණන වාර්තාව	.....	28 - 42
පරිච්ඡේදය 04 -	කාර්ය සාධන දර්ශකය	.....	43
පරිච්ඡේදය 05 -	තිරසර සංවර්ධන (SDG) අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය	.....	44 - 50
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	.....	51 - 56
පරිච්ඡේදය 07 -	අනුකූලතා වාර්තාව	.....	57 - 64

01.පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම.

වර්ෂ 1940 අංක 09 දරන පුරාවිද්‍යා ආඥාපනතින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නීති ගත කර ඇත. 1890 ජූලි 07 වැනි දින ආරම්භ කරන ලද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට 2022 ජූලි 07 වන දිනට වසර 132 ක් සපිරිනි. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ ශ්‍රී ලාංකීය ජාතික උරුමයන් නෛතිකව හඳුනා ගැනීම හා ජාතික උරුමයන් සංරක්ෂණය කිරීම ඒ පිළිබඳ නිසි කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමයි. එම කර්තව්‍යය සාක්ෂාත් කර ගැනීම සඳහා 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සම්පාදනය කර ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වත්මන් කටයුතු බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ සිදුවේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

- **දැක්ම**

  සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය මනා ලෙස කළමනාකරණය කර මතු පරපුරට දායාද කිරීම.

- **මෙහෙවර**

  ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණයේ වගකීම දරන උපරිම ආයතනය සහ එහි ප්‍රධාන නියාමන ආයතනය ලෙස කටයුතු කිරීම.

- **අරමුණු**


ඉහත මෙහෙවර ඉෂ්ට කර ගැනීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අරමුණු කිහිපයකි.

01. සමස්ත පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂණය
02. පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම
    i). ස්ථාන සහ ස්මාරක
    ii). චංචල පුරාවස්තු
03. පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන අවබෝධය ප්‍රවර්ධනය කිරීම.
04. පුරාවිද්‍යාත්මක ස්ථාන / ස්මාරක හා චංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තුව.
05. පර්යේෂණ.
06. සම්පත් ප්‍රවර්ධනය
    i). මානව
    ii). ආයතනික

1.3. ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය හඳුනා ගැනීම.
2. ශ්‍රී ලංකාවේ චංචල හා නිශ්චල පුරාවිද්‍යාත්මක උරුමය ලේඛනගත කිරීම.
3. පුරාවිද්‍යාත්මක උරුමය විනයානුකූලව සංරක්ෂණය කිරීම, නඩත්තු කර පවත්වාගෙන යාම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
4. පුරාවිද්‍යා ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
5. සංස්කෘතික දේපල පනත ක්‍රියාත්මක කිරීම.
6. පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක මහජනයා වෙත ඉදිරිපත් කිරීම.
7. විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දී පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථානවලට සිදුවන හානිය පිළිබඳ හානි ඇගයුම් සමීක්ෂණ කටයුතු කිරීම.

1.4. <u>සංවිධාන සටහන</u>



01	පාලන	-	පාලන
02	පුහුණු හා වෙනත්	-	පුහුණු හා වෙනත්
03	ව්‍යා. ක්‍රියා. හා ඇ.	-	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඇගයීම
04	ව්‍යා. මෙ. හා අ.	-	ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ
05	ග.ලේ.	-	ගවේෂණ හා ලේඛනගත කිරීම්
06	පුවි. බල.තක්.	-	පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරුකරණය
07	මුහුදු. පු. ගවේ	-	මුහුදු පුරාවිද්‍යා ගවේෂණය
08	කැණීම්	-	කැණීම්
09	කැ.තක්.හා.පර්	-	කැණීම් තක්සේරුකරණය හා පර්යේෂණ
10	වාස්තු විද්‍යා සං.	-	වාස්තු විද්‍යා සංරක්ෂණ
11	වැඩ හා ලෝ.උ.	-	වැඩබිම් හා ලෝක උරුම
12	භූමි අලංකරණය	-	භූමි කළමනාකරණය
13	නව ඉදිකිරීම්	-	නව ඉදිකිරීම්
14	රසායන සංරක්ෂණ	-	රසායන සංරක්ෂණය
15	චිත්‍ර සංර.	-	චිත්‍ර සංරක්ෂණය
16	පුරාවස්තු සංර	-	පුරාවස්තු සංරක්ෂණය
17	අභි. නාණක විද්‍යා	-	අභිලේඛන හා නාණක විද්‍යා
18	අභිලේඛන	-	අභිලේඛන
19	නාණක විද්‍යා	-	නාණක විද්‍යා
20	ප්‍රවර්ධන	-	ප්‍රවර්ධන
21	තොරතුරු කළ. හා ප්‍රකා.	-	තොරතුරු කළමනාකරණ හා ප්‍රකාශන
22	වැඩබිම් හා ස්මාරක	-	වැඩබිම් හා ස්මාරක
23	ආයතනික ගොඩනැගිලි	-	ආයතනික ගොඩනැගිලි
24	ජේ.කා.නි./ජේ.සැ.ශි.	-	ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී / ජ්‍යෙෂ්ඨ සැලසුම් ශිල්පි
25	නි.අ. / ස.අ.	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ
26	ශ්‍රී. ලං. ප. සේ.	-	ශ්‍රී ලංකා පරිපාලන සේවය
27	ශ්‍රී. ලං. ග. සේ.	-	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
28	ශ්‍රී. ලං. ඉ. සේ.	-	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
29	ශ්‍රී. ලං. වා. සේ.	-	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවය
30	ශ්‍රී. ලං. විද. සේ.	-	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය
31	ක. සේ.නි.සේ.	-	කළමනාකරණ සේවා නිලධාරී සේවය
32	ශ්‍රී. ලං. තා. සේ.	-	ශ්‍රී ලංකා තාක්ෂණ සේවය

1.5. <u>දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ / පළාත් හා දිස්ත්‍රික් කාර්යාල</u>

❖ **දෙපාර්තමේන්තුව යටතේ පවතින ප්‍රධාන අංශ**

ශාස්ත්‍රීය අංශ

- ගවේෂණ හා ලේඛනගත කිරීම් අංශය
- කැණීම් අංශය
- කෞතුකාගාර අංශය
- වාස්තු විද්‍යා සංරක්ෂණ අංශය
- රසායන සංරක්ෂණ අංශය
- අභිලේඛන හා නාණක විද්‍යා අංශය
- නඩත්තු අංශය
- ප්‍රවර්ධන අංශය
- මාධ්‍ය අංශය

ශාස්ත්‍රීය නොවන අංශ

- ගිණුම් අංශය
- පාලන අංශය
- ව්‍යාපෘති මෙහෙයුම් හා ඇගයීම් අංශය
- නීති අංශය

❖ **දෙපාර්තමේන්තුව යටතේ පවතින පළාත් හා දිස්ත්‍රික් පුරාවිද්‍යා කාර්යාල**

1 බස්නාහිර පළාත

2 මධ්‍යම පළාත

3 දකුණු පළාත
- ගාල්ල/ මාතර දිස්ත්‍රික්ක
- හම්බන්තොට දිස්ත්‍රික්කය

4 උතුරු පළාත
- යාපනය/ කිළිනොච්චි දිස්ත්‍රික්ක
- මන්නාරම්/ මුලතිව්/ වව්නියා දිස්ත්‍රික්ක

5 වයඹ පළාත

6 උතුරුමැද පළාත
- අනුරාධපුර දිස්ත්‍රික්කය
- පොළොන්නරුව දිස්ත්‍රික්කය

7 ඌව පළාත
- බදුල්ල දිස්ත්‍රික්කය
- මොණරාගල දිස්ත්‍රික්කය

8 සබරගමුව පළාත
- කෑගල්ල දිස්ත්‍රික්කය
- රත්නපුර දිස්ත්‍රික්කය

9 නැගෙනහිර පළාත
- අම්පාර/මඩකලපුව දිස්ත්‍රික්ක
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

❖ **පළාත් කාර්යාල යටතේ ඇති කලාප කාර්යාල**

1	**බස්නාහිර පළාත**	අංක 01	කෝට්ටේ කලාපය
		අංක 02	කොළඹ කලාපය
		අංක 03	උඩුගම්පොළ කලාපය
		අංක 04	ගම්පහ කලාපය
		අංක 05	පතහවත්ත
		අංක 06	ගනේඋඩ
2	**මධ්‍යම පළාත**	අංක 01	සීගිරිය
		අංක 02	දඹුල්ල
		අංක 03	මැණික්දෙන
		අංක 04	මොරගහකන්ද
		අංක 05	නාලන්ද ගෙඩිගේ
		අංක 06	මාතලේ
		අංක 07	හාරිස්පත්තුව
		අංක 08	මහනුවර
		අංක 09	යටිනුවර
		අංක 10	උඩුනුවර
		අංක 11	කුණ්ඩසාලය
		අංක 12	හගුරන්කෙත
		අංක 13	කොත්මලේ
		අංක 14	නුවරඑළිය
3	**දකුණු පළාත -** ගාල්ල/ මාතර දිස්ත්‍රික්ක	අංක 01	හික්කඩුව
		අංක 02	ගාල්ල
		අංක 03	කඩවත් සතර හා ගාලු කොටුව
		අංක 04	මාතර
		අංක 05	කඹුරුපිටිය
4	**දකුණු පළාත -** හම්බන්තොට දිස්ත්‍රික්කය	අංක 01	කටුවන
		අංක 02	කසාගල
		අංක 03	හම්බන්තොට
		අංක 04	තිස්සමහාරාමය
5	**උතුරු පළාත -** යාපනය/ කිලිනොච්චි දිස්ත්‍රික්ක	අංක 01	යාපනය
		අංක 02	දුපත්
		අංක 03	වලිකාමම්
		අංක 04	වඩමාරච්චි
		අංක 05	තෙන්වාරච්චි
		අංක 06	කිලිනොච්චි

6	**උතුරු පළාත -** මන්නාරම/ මුලතිව්/ වව්නියා දිස්ත්‍රික්ක	අංක 01	වවුනියාව
		අංක 02	මුලතිව්
		අංක 03	මන්නාරම
7	**වයඹ පළාත** කුරුණෑගල / පුත්තලම දිස්ත්‍රික්ක	අංක 01	පුත්තලම
		අංක 02	තෝනිගල
		අංක 03	හලාවත
		අංක 04	යාපහුව 01
		අංක 05	යාපහුව 02
		අංක 06	අරන්කැලේ
		අංක 07	කුරුණෑගල
		අංක 08	පඬුවස්නුවර
		අංක 09	දඹදෙණිය
		අංක 10	හස්තිකුච්චි
8	**උතුරුමැද පළාත** අනුරාධපුර දිස්ත්‍රික්කය	අංක 01	පදවිය
		අංක 02	කිරලාගල
		අංක 03	මිහින්තලය
		අංක 04	නැගෙනහිර නුවර ගම් පළාත
		අංක 05	පූජා නගරය
		අංක 06	තන්තිරිමලය
		අංක 07	මානාකන්ද
		අංක 08	රිටිගල
		අංක 09	උපුල්වෙහෙර
		අංක 10	මැදවච්චිය
		අංක 11	තඹුත්තේගම
		අංක 12	නොච්චියාගම
		අංක 13	ඇතුල්නුවර
9	**උතුරුමැද පළාත** පොළොන්නරුව දිස්ත්‍රික්කය	අංක 01	පොළොන්නරුව
		අංක 02	මැදිරිගිරිය
		අංක 03	නාමල්පොකුණ
10	**ඌව පළාත** බදුල්ල දිස්ත්‍රික්කය	අංක 01	නාගදීපය
		අංක 02	බදුල්ල
		අංක 03	දියතලාව
		අංක 04	පස්සර
11	**ඌව පළාත** මොණරාගල දිස්ත්‍රික්කය	අංක 01	ගලබැද්ද
		අංක 02	මාළිගාවිල

		අංක 03	බිබිල
		අංක 04	බුදුරුවගල
12	**සබරගමුව පළාත** කෑගල්ල දිස්ත්‍රික්කය	අංක 01	දනගිරිගල
		අංක 02	දැලිවල
		අංක 03	කෑගල්ල
		අංක 04	සීතාවක
13	**සබරගමුව පළාත** රත්නපුර දිස්ත්‍රික්කය	අංක 01	රත්නපුර
		අංක 02	මඩුවන්වෙල
		අංක 03	බුදුගල
14	**නැගෙනහිර පළාත** අම්පාර/ මඩකලපුව දිස්ත්‍රික්ක	අංක 01	පදියදොර
		අංක 02	ඔවාගිරිය
		අංක 03	දීඝවාපිය
		අංක 04	සමන්තුරේ
		අංක 05	ලාහුගල
15	**නැගෙනහිර පළාත** ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය	අංක 01	ගෝමරන්කඩවල
		අංක 02	ත්‍රිකුණාමලය
		අංක 03	සේරුවිල

1.6 <u>දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්</u>

දෙපාර්තමේන්තුවේ අරමුදල් ප්‍රවාහය භාණ්ඩාගාර ප්‍රතිපාදන හා පොදු තැන්පත් ගිණුම (මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන / බාහිර ආයතන ප්‍රතිපාදන / පෞද්ගලික ආධාර / විදේශ ආධාර) යටතේ සිදුවේ.

❖ **භාණ්ඩාගාර ප්‍රතිපාදන**

2022 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය මඟින් දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදන

වැඩසටහන / වැය විෂය			**මූල්‍ය ප්‍රතිපාදන (රු. මිලියන)**		
			මූලධන	**පුනරාවර්තන**	**මුළු ප්‍රතිපාදන**
වැඩසටහන	01	207 – 01 - 01	6.000	292.900	298.900
වැඩසටහන	02	207 – 02 - 02	108.000	981.100	1,089.100
එකතුව			**114.000**	**1,274.000**	**1,388.000**

❖ **2022 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් හා බාහිර ආයතන ආධාර මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන**

ප්‍රතිපාදන මූලාශ්‍රය	මුල්‍ය ප්‍රතිපාදන (රු.)
මධ්‍යම සංස්කෘතික අරමුදල	1,000,000.00
බාහිර ආයතන ආධාර අරමුදල්	12,707,493.50

***සටහන:**

මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන සහ බාහිර ආයතන ආධාර මඟින් ලබා දෙන ප්‍රතිපාදන ඉදිරි වර්ෂ සඳහා ද ක්‍රියාත්මක වේ.

1.7. <u>විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු</u>

1. රජගලතැන්න සංරක්ෂණ ව්‍යාපෘතිය

(අ) ව්‍යාපෘතියේ නම :- රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංවර්ධනය

(ආ) දායක නියෝජිත ආයතනය :- ඇමරිකානු අරමුදල

(ඇ) ව්‍යාපෘති ඇස්තමේන්තු ගත වියදම :- 2022 වර්ෂය සඳහා විදේශාධාර යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීය.

(ඈ) ව්‍යාපෘති කාල සීමාව :- 2017 – 2022

2. මහනුවර රජවාසල සංරක්ෂණය

(අ) ව්‍යාපෘතියේ නම :- මහනුවර රජවාසල සංරක්ෂණ ව්‍යාපෘතිය

(ආ) දායක නියෝජිත ආයතනය :- ඇමරිකානු අරමුදල

(ඇ) ව්‍යාපෘති ඇස්තමේන්තු ගත වියදම :- ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 265,000.00

(ඈ) ව්‍යාපෘති කාල සීමාව :- 2022 – 2023

02.පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 <u>විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක</u>

2022 වර්ෂය සඳහා ප්‍රතිශෝධිත අයවැය මඟින් වෙන් කරන ලද මූලධන ප්‍රතිපාදන අනුව පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණය, කැණීම් හා පර්යේෂණ, අභිලේඛන හා නාණක කටයුතු, සංරක්ෂණ සහ නඩත්තු, ප්‍රවර්ධනය හා මහජන ප්‍රදර්ශන යටතේ කාර්තු වශයෙන් පළාත් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වූ ව්‍යාපෘති ගණන 204 කි. එහෙත් 2022 වර්ෂයේ පැවති අයහපත් මූල්‍ය වාතාවරණය හේතුවෙන් ප්‍රතිපාදන සීමා වීම හා දෙපාර්තමේන්තුවට ප්‍රතිපාදන නියමිත කාලය තුළ ලැබීමට පමාවීම සිදු වූ බැවින් ඇතැම් ව්‍යාපෘතීන් වැය සටහන් කළ ද ක්‍රියාත්මක නොවූ අතර, ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ගණන 180 ක් පමණ විය. මෙම තත්ත්වය තුළ බොහොමයක් ව්‍යාපෘතිවල ආරම්භක වැඩ පමා වීම සිදු වූ බැවින් හා රුපියල අවප්‍රමාණ වීම හා අනපේක්ෂිත ලෙස භාණ්ඩ හා සේවාවන්හි සාමාන්‍ය මිල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් රට තුළ උද්ගත වූ ආර්ථික හා සාමාජීය ව්‍යාකූල තත්ත්වයන් හමුවේ අපේක්ෂිත භෞතික කාර්යසාධන මට්ටම අත්කර ගැනීමට හැකි වූ ව්‍යාපෘති ගණන 142 කි. ඒ අනුව, 2022 වර්ෂයේ මූල්‍ය වැය කිරීම් පහත සංඛ්‍යා සටහන් මඟින් සාරාංශ ගත කර ඉදිරිපත් කර ඇත.

වැඩසටහන් අනුව 2022 වර්ෂය සඳහා වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන සහ ප්‍රගතිය

වැඩසටහන	වැය විස්තරය	ප්‍රතිශෝධිත අයවැය ප්‍රතිපාදන (රු.මි.)	මු.රෙ. 66 මාරු කිරීම් අනුව ප්‍රතිපාදන (රු.මී.)	තත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය (%)
වැඩ සටහන 01 207-01-01	පුනරාවර්තන වියදම්	292.900	292.070	257.043	88%
සාමාන්‍ය පරිපාලනය	මූලධන වියදම්	6.000	6.830	5.617	82%
	උප එකතුව	**298.900**	**298.900**	**262.660**	**88%**
වැඩ සටහන 02 207-02-02	පුනරාවර්තන වියදම්	981.100	979.650	843.378	86%
පුරාවිද්‍යා සේවය	මූලධන වියදම්	108.000	109.450	79.822	73%
	උප එකතුව	**1,089.100**	**1,089.100**	**923.200**	**85%**
මුළු මූල්‍ය ප්‍රතිපාදන	**පුනරාවර්තන වියදම්**	**1,274.000**	**1,271.720**	**1,100.421**	**86%**
	මූලධන වියදම්	**114.000**	**116.280**	**85.439**	**73%**
	මුළු එකතුව	**1,388.000**	**1,388.000**	**1,185.860**	**85%**


මූලාශ්‍රය: CIGAS - පුරාවිද්‍යා දෙපාර්තමේන්තු

ඉහත සංඛ්‍යා සටහනට අනුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කිරීමේ ප්‍රගතිය සලකා බලන විට මූලධන වියදම රුපියල් මිලියන 85.439 ක් හා එහි මූල්‍ය ප්‍රගතිය 73% ක් ලෙස ද, පුනරාවර්තන වියදම රුපියල් මිලියන 1,100.421 ක් හා එහි මූල්‍ය ප්‍රගතිය 86% ක් ලෙස ද වාර්තා කරමින් තත්‍ය වියදම රුපියල් මිලියන 1,185.860 ක් විය. ඒ අනුව, 2022 වර්ෂයේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 85% ක් විය.

2022 වර්ෂය සඳහා වෙන් කර ඇති මූලධන ප්‍රතිපාදන හා ප්‍රගතිය

වැය විෂය	වැය විස්තරය	සංශෝධිත ප්‍රතිපාදන (රු.මි.)*	ඉලක්ක ගත ව්‍යාපෘති ගණන	ඉලක්ක ලගා කර ගැනීම්	තත්‍ය වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය (%)
207-01-01-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	0.500	1				
207-02-02-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2.000	3		1.451	73%	50%
207-01-01/ 207-02-02	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	3.830			3.319	86%	
207-01-01/ 207-02-02	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	3.500			3.396	97%	
207-01-01/ 207-02-02-2041	කාර්ය මණ්ඩල පුහුණු	1.500			1.190	79%	
207-02-02-2001(5)/ 207-02-02-2509 (5)	රජගල පුරාවිද්‍යා ස්ථානය - *(සංරක්ෂණ ව්‍යාපෘති 9 න් 6 ක වැඩ අවසන් කර ඇත. අංශ හා මූලික පහසුකම් පවත්වා ගෙන යාම අනෙකුත් ව්‍යාපෘති වේ.)*	36.000	17	7	23.462	65%	60%
207-02-02-2509 (8)	පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණය, කැණීම් හා පර්යේෂණ, අභිලේඛන හා නාණකවිද්‍යා කටයුතු	9.000	34	31	8.277	92%	90%
207-02-02-2509 (9)	පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය හා නඩත්තු කිරීම	43.900	114	75	35.750	81%	84%
207-02-02-2509 (9) 13	මහනුවර රජවාසල සංරක්ෂණ ව්‍යාපෘතිය	7.600	1		2.778	37%	60%
207-02-02-2509 (10)	පුරාවිද්‍යාත්මක ස්ථාන සහ ස්මාරක ප්‍රවර්ධනය හා මහජන ප්‍රදර්ශන	5.000	32	27	4.266	85%	86%
207-02-02-2509 (12)	රිටිගල පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය	0.500	1	1	0.490	98%	95%
207-02-02-2509 (15)	කන්නියා උණු වතුර ළිං පරිශ්‍රය නඩත්තු කිරීම	2.951	1	1	1.059	36%	95%
	මුළු එකතුව	**116.280**	**204**	**142**	**85.439**	**73%**	**82%**
පුනරාවර්තන (1303)							
207-01-01-1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2.000	2	1	0.183	9%	75%
207-02-02-1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	6.500	18	9	4.841	74%	77%

** සටහන : මු.රෙ. 66 මාරු කිරීම් අනුව ප්‍රතිපාදන*



මේ අනුව 2022 වසරේ මුහුණ දීමට සිදු වූ අභියෝග හමුවේ වුව ද දෙපාර්තමේන්තුවට වෙන් වූ ප්‍රතිපාදනයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝජනය කර ගනිමින් ශාස්ත්‍රීය අංශයන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල එක්ව සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති 200 කට ආසන්න සංඛ්‍යාවක් සාර්ථකව ක්‍රියාවට නංවමින් 82% ක සමස්ත භෞතික කාර්යසාධනයක් අත්කර ගැනීමට හැකි විය.

එසේම බාහිර ප්‍රතිපාදනයක් යටතේ ද සැලකිය යුතු කාර්යභාරයක් 2022 වර්ෂය තුළදී සිදු කරන ලදි. මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කළ මිහින්තලය අනුලාදේවි ස්ථූප කැණීම් ව්‍යාපෘතිය 2022 වර්ෂයේ අවසන් කළ අතර, පොදු තැන්පත් හා බාහිර ආයතන අරමුදල් ප්‍රතිපාදන යටතේ ගවේෂණ, කැණීම්, සංරක්ෂණ හා ප්‍රවර්ධන වැඩසටහන් යටතේ 2022 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වූ ව්‍යාපෘති ගණන 31 ක් විය.

2022 වර්ෂය සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදලින් හා බාහිර ආයතන ආධාර මඟින් ලබා දී ඇති මූල්‍ය ප්‍රතිපාදන හා ප්‍රගතිය

ප්‍රතිපාදන මූලාශ්‍රය	ව්‍යාපෘති ගණන	මූල්‍ය ප්‍රතිපාදන (රු.)	මූල්‍ය ප්‍රගතිය (රු.)		භෞතික ප්‍රගතිය %
			(රු.)	%	
මධ්‍යම සංස්කෘතික අරමුදල.	01	1,000,000.00	997,760.00	100%	100%
පොදු තැන්පත් හා බාහිර ආයතන අරමුදල්	31	12,707,493.50	3,311,474.75	26%	45%

**පොදු තැන්පත් සහ බාහිර ආයතන ආධාර මඟින් ලබා දෙන ප්‍රතිපාදන ඉදිරි වර්ෂ සඳහා ද ක්‍රියාත්මක වේ.*

2014 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා මධ්‍යම සංස්කෘතික අරමුදල් ප්‍රතිපාදනවල ඉතිරි ප්‍රතිපාදන උපයෝජනය කර ගනිමින් කැණීම් ව්‍යාපෘති 3 ක්, සංරක්ෂණ ව්‍යාපෘති 11 ක්, නඩත්තු ව්‍යාපෘති 08 ක් හා කෞතුකාගාර ව්‍යාපෘති 1 ක් ඇතුළත්ව ව්‍යාපෘති 23 ක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු ද 2022 වසරේ සිදු කරන ලද අතර, ඉන් ව්‍යාපෘති 6 ක වැඩ වර්ෂය තුළ අවසන් කර ඇත.

2022 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන හා පොදු තැන්පත් හා බාහිර ආයතන ආධාර යටතේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති,

ගවේෂණ හා ලේඛනගත කිරීම්

පුරාවිද්‍යා ස්ථානවල මායිම් හඳුනා ගැනීම හා නිරවුල් කිරීම, ආරක්ෂිත ස්මාරක සහ පුරාවිද්‍යා රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක භූගෝලීය දත්ත ගොනු සැකසීම, ශාස්ත්‍රීය ගවේෂණ ස්ථාන පරීක්ෂාව, බනිජ නිස්සාරණ ව්‍යාපෘති ස්ථාන පරීක්ෂාව, පුරාවිද්‍යා හානි ඇගයීම් ස්ථාන පරීක්ෂාව, පුරාවස්තු විනාශය වැළැක්වීම, චංචල පුරාවස්තු ලේඛනගත කිරීම, GIS අන්තර්ජාල බිහිදොර යාවත්කාලීන කිරීම හා තොරතුරු එක්රැස් කිරීම, ජාතික පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය සඳහා තොරතුරු රැස් කිරීම හා වාර්තා සැකසීම ඇතුළත්ව ගවේෂණ ව්‍යාපෘති 28 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද අතර, පොදු තැන්පත් හා බාහිර ආයතන ආධාර යටතේ ක්ෂේත්‍ර ගවේෂණ හා පුරාවිද්‍යා බලපෑම් ඇගයීම් ව්‍යාපෘති 10 ක් ද ක්‍රියාත්මක විය.

ස්ථාන පරීක්ෂාව ක්ෂේත්‍ර කටයුතු



මාතර දිස්ත්‍රික්කයේ හක්මන - බනිජ පරීක්ෂාව



ලත්පදුර පැරණි ලෙන පරීක්ෂාව



ගනේතැන්න පුරාණ විහාරය

කැණීම්

දීඝවාපීය ස්තූප මළුව කැණීම, මිහින්තලය අනුලාදේවි ස්තූප කැණීම, අම්පාර සමන්ගල ස්තූප කැණීම, ගිරිබාව පබළුගල පුරාණ වීදුරු තාක්ෂණය පිළිබඳ පර්යේෂණ කැණීම හා කවුඩාගල පැරණි ස්තූපය පාදා ගැනීමේ කැණීම ඇතුළත්ව කැණීම් ව්‍යාපෘති 5 ක් 2022 වර්ෂය තුළ සිදු කරන ලදි.

මිහින්තලය අනුලාදේවි ස්තූප කැණීම









භාණ්ඩාගාර ප්‍රතිපාදන හා මධ්‍යම සංස්කෘතික අරමුදල් යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකි. 2022 වර්ෂයේ මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් විය.

දීඝවාපිය ස්තූප මළුව කැණීම




දීඝවාපි ස්තූපය සංරක්ෂණයට සමගාමීව ස්තූපයෙහි සලපතල මළුව හා ප්‍රාකාර බැම්ම පාදා ගැනීම අරමුණු කරමින් මෙම කැණීම් ව්‍යාපෘතිය සිදු වේ.

අභිලේඛන හා නාණක විද්‍යා

අභිලේඛන පර්යේෂණ සංග්‍රහය කෘතියේ කටයුතු, ශීලාලේඛන පිටපත් කිරීම (දිවයින පුරා), කාසි සුචිගත කිරීම, අභිලේඛන හා නාණක විද්‍යා අංශය යටතේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති විය.




ශීලාලේඛන පිටපත් කිරීම

කෞතුකාගාර

කෞතුකාගාර පවත්වා ගෙන යාම, අධීක්ෂණය හා ස්ථාන පරීක්ෂාව, කෞතුක භාණ්ඩ පිරි සංරක්ෂණය, ප්‍රදර්ශනයේ අඩුපාඩු සැකසීම හා කෞතුකාගාර ප්‍රදර්ශන ප්‍රවර්ධනය යටතේ ව්‍යාපෘති 19 ක් 2022 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි.

කෞතුකාගාර ප්‍රදර්ශන ප්‍රවර්ධන හා කළමනාකරණ කටයුතු



දැදිගම කෞතුකාගාරය



මහනුවර කෞතුකාගාරය

වාස්තු විද්‍යා හා රසායන සංරක්ෂණ

රිටිගල පුරාවිද්‍යා ස්ථානයේ බන්දා පොකුණ සංරක්ෂණ ව්‍යාපෘතිය ඇතුළුව වාස්තු විද්‍යා සංරක්ෂණ ව්‍යාපෘති 33 ක් හා රසායන සංරක්ෂණ ව්‍යාපෘති 34 ක් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ 2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද අතර, පොදු තැන්පත් හා බාහිර ආයතන අරමුදල් යටතේ ද සංරක්ෂණ ව්‍යාපෘති 08 ක් ක්‍රියාත්මක විය.



ශ්‍රී සුගතාරාම විහාරයේ ධර්ම ශාලාව සංරක්ෂණය - තිඹිරිගස්කටුව



කුරුන්දි විහාරය සංරක්ෂණය මුලතිව්



අම්බුළුගල දන්තපාය ටැම්පිට විහාරය සංරක්ෂණය - කෑගල්ල



දිසවාපි ස්ථූප සංරක්ෂණය



නීලගිරිය ස්ථූප සංරක්ෂණය




රිටිගල පුරාවිද්‍යා ස්ථානයේ බන්දා පොකුණ සංරක්ෂණය

2022 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද භායනයට ලක් වී ඇති සිතුවම් හා මූර්ති, පුරාවස්තු සංරක්ෂණ ව්‍යාපෘති













ප්‍රවර්ධන

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරෙන කාර්යයන් පිළිබඳ මහජනතාවට අවබෝධය ලබා දීම සහ පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීම සඳහා මහජන අවබෝධය ලබා දීමේ අරමුණින් විවිධ කාර්යයන් ප්‍රවර්ධන අංශය මගින් 2022 වර්ෂය තුළ දී සිදු කරන ලදි.

පුරාවිද්‍යා සමුළුව පැවැත්වීම





ඉකුත් වසරේ පුරාවිද්‍යා කටයුතුවල ප්‍රතිඵල පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රවීණ හා ආධුනික විද්‍යාර්තීන් හා පුරාවිද්‍යාඥයින් අතර දැනුම හුවමාරු කර ගැනීමේ අරමුණින් හා ඉදිරි පුරාවිද්‍යාත්මක පර්යේෂණ හා ක්ෂේත්‍ර කටයුතු සඳහා පුරාවිද්‍යා පර්යේෂකයින්ට ඉඩ ප්‍රස්ථාව විවර කර දෙමින් සෑම වසරකම පුරාවිද්‍යා දිනයට සමගාමීව ගරු ඇමතිතුමාගේ ප්‍රධානත්වයන් පුරාවිද්‍යා සමුළුව පවත්වනු ලබන අතර, මෙම වසරේ පුරාවිද්‍යා සමුළුව මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්විණි.

අන්තර්ජාල ප්‍රකාශන එළිදැක්වීම



e-Heritage අන්තර්ජාල යෙදවුම් ජනගත කිරීම





සංවිධානය - ගවේෂණ අංශය

මාර්ගගත ශාස්ත්‍රීය දේශනමාලාව



පොලිස් නිලධාරීන්, බහුකාර්ය සේවකයන් හා ගම්වාසීන් දැනුවත් කිරීමේ දේශන පැවැත්වීම



කෑගල්ල



පොළොන්නරුව

ක්ෂේත්‍රගත පුහුණු, රුක්රෝපණ වැඩසටහන් හා ශ්‍රමදාන පැවැත්වීම





යාපනය ප්‍රාදේශීය කාර්යාලය



යුධගනාව පුරාවිද්‍යා ස්ථානයේ ශ්‍රමදාන වැඩසටහන

පොත් අලෙවිසැල් විවෘත කිරීම



මාතලේ

නඩත්තු

පළාත් තුළ ඇති පුරාවිද්‍යා ස්ථාන කලාප මට්ටමින් (කලාප 96) දෙනිකව නඩත්තු කර පවත්වා ගෙන යාම, පුරාවිද්‍යා ස්ථාන ප්‍රවර්ධනය සඳහා මාර්ග ප්‍රවේශ සැකසීම, විස්තරාත්මක පුවරු, රක්ෂිත පුවරු හා දිශානති පුවරු යෙදීම, මායිම් කණු සිටු වීම, සනීපාරක්ෂක හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කිරීම ඇතුළත්ව නඩත්තු ව්‍යාපෘති 72 ක් පමණ භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරන ලද අතර, කන්නියා උණු වතුර ළිං පරිශ්‍රය නඩත්තු කිරීමේ කටයුතු ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධික්ෂණය යටතේ සිදු විය.

රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපෘතිය

රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපෘතියේ අංශ හා මූලික පහසුකම් පවත්වා ගෙන යාම, අර්ධ වශයෙන් නිමකර ඇති අත්‍යවශයෙන්ම නිමකළ යුතු සංරක්ෂණ කාර්යයන්, නව සංරක්ෂණ කාර්යයන් හා භූ දර්ශනය සැකසීමේ කාර්යයන් ද 2022 වර්ෂය තුළ දී සිදු කරන ලදි.







අභියෝග හා ඉදිරි ඉලක්ක

පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුමයන්ට ස්වාභාවික හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන හානිය වළක්වා සුරක්ෂිත කිරීම සඳහා මැදිහත් වෙමින් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක කටයුතුවල ස්ථායීභාවය, එහි ගුණාත්මක ප්‍රවර්ධනය හා චිරස්ථායීභාවය පවත්වා ගනිමින් පුරාවිද්‍යා ස්ථාන ප්‍රශස්ත මට්ටමට ගැනීම හා සුවිශේෂී වූ පුරාවිද්‍යා ස්ථාන උත්ශ්‍රේණි කිරීම, හඳුනා ගනු ලබන නව ගවේෂණ හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, වාර්තා කිරීම හා සංරක්ෂණයට පියවර ගැනීම, පුරාවිද්‍යාත්මක උරුමයන් සහ ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම මඟින් භූමියේ සංස්කෘතික සංචාරක හා පාරිසරික සංචාරක කර්මාන්තය නගා සිටු වීම තුළින් ඒ ආශ්‍රිත රැකියා අවස්ථා බිහි වී ප්‍රජාවේ සමාජ හා ආර්ථික මට්ටම් ඉහළ නැංවීම මඟින් ප්‍රදේශයේ හා රටේ ආර්ථික සංවර්ධනයට දායකත්වයක් ලබා දීම දෙපාර්තමේන්තුවේ ඉදිරි ඉලක්ක හා

අරමුණු අතර ප්‍රධාන වේ. මෙම අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට යාමේ දී දෙපාර්තමේන්තුව විවිධ ගැටළු හා අභියෝගයන්ට මුහුණ දීමට සිදු වේ. එම ගැටළු හා අභියෝග අතර,

- නෛතික රාමුව තුළ පවතින ඉඩකඩ සීමිත බැවින්, ජීවමාන සංස්කෘතීන් පවත්වාගෙන යාමේ දී පැනනඟින ප්‍රායෝගික ගැටළු නිරාකරණය කිරීමට නොහැකි වීම සහ ගැසට් කරනු ලබන පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්මාරක හා රක්ෂිතයන්හි මැනුම් කටයුතු සිදු කිරීමේ අපහසුතාවයක් පැවතීම.

- පුරාවස්තු විනාශයන් පිළිබඳව පරීක්ෂා කිරීමේ ගැටළු හා නීතිය ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන ගැටළු. විකල්ප නීති මඟින් කටයුතු කිරීම, පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පනත හා වෙනත් පනත් මඟින් කටයුතු කිරීම. පුරාවිද්‍යා පනත ප්‍රකාර චෝදනා කල්පසු වී ඉදිරිපත් කිරීම.

- ආරක්ෂා කළ යුතු පුරාවිද්‍යා ස්ථාන 2500ක් පමණ ඇති අතර ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති බැවින්, පුරාවිද්‍යා ස්ථානවල ආරක්ෂාව සඳහා නිලධාරීන් යෙදවීමේ ගැටලු.

- ඛනිජ නිස්සාරණ බලපත්‍ර ලබා දීමේ ගැටලු, සංවර්ධන යෝජනා සඳහා වන හානි ඇගයීම් වාර්තා ලබා දීමේ ගැටලු හා මිත්‍යාමත සහ නොදැනුවත් බව නිසා ඇතිවන අනවසර කැණීම්.

- වෙනත් ආයතනවලට අයත් (වනජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ආරක්ෂක අමාත්‍යාංශය වැනි) පුරාවස්තු සහිත ප්‍රදේශවල ගවේෂණ, කැණීම් හා පර්යේෂණ, සංරක්ෂණ, නඩත්තු හා ඉදිකිරීම් ආදි පුරාවිද්‍යාත්මක කටයුතු සිදු කිරීමේ දී අවසර ගැනීමේ ගැටලු.

- පුරාවිද්‍යා වටිනාකම් සහිත ඉඩම් නීති විරෝධී ලෙස අත්පත් කර ගැනිම හා භාවිතා කිරීම.

- ජීවමාන පුරාකෘති පවත්වාගෙන යාමේ ගැටලු.

- ආගමික ස්ථාන පවත්වාගෙන යාමේ දී ඇතිවන සංස්කෘතික ගැටලු.

- සංස්කෘතික උරුමය සහ ප්‍රජාව අතර සබඳතාව දුරස් වීම මත දිගුකාලීනව ක්ෂේත්‍රයේ පැවැත්මට අභියෝග එල්ලවීමට ඇති ප්‍රවණතාවය.

- ස්වාභාවික හා නීතිවිරෝධී මානව ක්‍රියාකාරකම්වලින් ස්මාරක හා පුරාවස්තූන් ආරක්ෂා කර ගැනිම.

- භෞතික හා මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවීම, වාර්ෂික අක්මුදල් ලබා දීමේ දී ඇතිවන ප්‍රමාද වීම් හා කපා හැරීම්, දෙපාර්තමේන්තුව සතු වාහන සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හා තිබෙන වාහන ඉතා පැරණි වීම, අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම මෙහි දී අභියෝග ලෙස දැක්විය හැකිය.

2.2 ඉදිරියේදී ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

- පුරාවිද්‍යා සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙනත් (බාහිර) ආයතනවල මූල්‍ය සහාය ලබා ගැනීම හා අරමුදල් ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. මේ යටතේ පුරාවිද්‍යා පර්යේෂණ හා සංරක්ෂණ අරමුදල ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය වන්නේ රටේ උරුමය කළමනාකරණය කිරීමේ නිත්‍ය ආයතනය ලෙස ක්‍රියා කිරීමයි. ඒ සඳහා සුදුසු වූ ආයතනවලට බලය පැවරීමක් ද පුරාවස්තු ආඥාපනතින් සිදු කොට ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, උරුමය පදනම් ආයතන, රාජ්‍ය ආයතන සහ නිලධාරීන් (දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරීන්, පොලිසිය, වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු, අධ්‍යාපන දෙපාර්තමේන්තුව වැනි...) පන්සල් හා වෙනත් ආගමික ස්ථාන මෙම වැඩසටහන සඳහා දායක කර ගැනීම.
- ශ්‍රී ලාංකීය උරුමය ආරක්ෂා කිරීම සඳහා මහජන අවබෝධය ලබා දීමේ අරමුණින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාවට නැංවීම හා සංරක්ෂණ කාර්යයන් සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගැනීම.
- පුරාවිද්‍යාත්මක උරුමයන් සංරක්ෂණය හා ප්‍රවර්ධනය සඳහා නවීන තාක්ෂණය යොදා ගැනීම.
- වාර්තා වන පුරාවස්තු සොරකම සහ පුරාවස්තු විනාශයන් අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම. පුරාවස්තු ආඥා පනත සංශෝධනය කිරීම, ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානයන්හි ආරක්ෂාව තහවුරු කිරීම, වාර්තා වන පුරාවස්තු විනාශයන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටලු දිවයිනේ සියලුම පොලිස් ස්ථාන දැනුවත් කිරීම හා සම්බන්ධීකරණ සහාය ලබා ගැනීම, ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම, නිලධාරීන් පුහුණු කිරීම.
- අරමුණු සාධනය කර ගැනීම සඳහා පාදක කර ගනු ලබන වැඩසටහන් හා ව්‍යාපෘතිවලට අදාළව නියමු සැලසුම් සකස් කිරීම හා එම වැඩසටහන් ප්‍රමුඛතාවය මත ක්‍රියාත්මක කිරීම, කාලානුරූපව අධීක්ෂණය කිරීම.
- පුරාවිද්‍යා ස්ථාන / ස්මාරක හා චංචල පුරාවස්තු සංරක්ෂණය, නඩත්තු කිරීම හා ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වාගෙන යාම.
- හඳුනා ගන්නා නව පුරාවිද්‍යාත්මක ක්ෂේත්‍ර ගවේෂණ හා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම එහි ප්‍රතිඵලයන් ප්‍රකාශයට පත් කිරීම හා සංරක්ෂණයට පියවර ගැනීම.
- ගැසට් කිරීම සඳහා හඳුනා ගෙන යෝජනා වී ඇති ස්මාරක සහ රක්ෂිත ගැසට් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීම හා උරුම කළමනාකරණය සඳහා දත්ත රැස්කිරීම හා ලේඛනගත කිරීම.
- දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා නවීකරණය හා පහසුකම් වැඩි දියුණු කිරීම.
- සනීපාරක්ෂක හා යටිතල පහසුකම් ප්‍රවර්ධනය හා විකල්ප බලශක්ති ප්‍රභවයන් යොදා ගැනීමට කටයුතු කිරීම. (පුරාවිද්‍යා ස්ථාන / කාර්යාලීය)
- මානව සම්පත් ප්‍රවර්ධනය.

2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන වැඩසටහන්

දෙපාර්තමේන්තුවේ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීම වස් ජාතික ප්‍රතිපත්තීන්ට අනුගතව ප්‍රමුඛතාවය මත හඳුනා ගත් සහ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු සංවර්ධන වැඩසටහන් මුල්කර 2023 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මේ සාරාංශය භාණ්ඩාගාර මුල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම් සමඟ පහත දක්වා ඇත.

2023 වර්ෂය සඳහා වෙන්කර ඇති මුල්‍ය ප්‍රතිපාදන

		මූලධන වියදම් (රු.මි)	පුනරාවර්තන වියදම් (රු.මි)
වැඩසටහන **01**	**207 - 01 - 01**	11.000	319.000
වැඩසටහන **02**	**207 - 02 - 02**	150.000	967.000
		161.000	**1,286.000**
සමස්ත මුල්‍ය ප්‍රතිපාදන			**1,447.000**

2023 වර්ෂය සඳහා සාමාන්‍ය පරිපාලනය හා පුරාවිද්‍යා සේවය යටතේ ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම (සාරාංශය)

වැය ශීර්ෂය	වැඩ විස්තරය	මූලධන (රු.මි.)	පුනරාවර්තන (රු.මි)	ව්‍යාපෘති ගණන
වැඩසටහන - 01 (සමාන්‍ය පරිපාලනය)				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම			
207-01-01-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	5.000		2
207-01-01-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.000		
207-01-01-2003	වාහන	3.000		
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම			
207-01-01-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	0.500		
207-01-01-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.000		
	හැකියා වර්ධනය			
207-01-01-2401	කාර්ය මණ්ඩල පුහුණු	0.500		9
	උප එකතුව	**11.000**		**11**

වැය ශීර්ෂය	වැඩ විස්තරය	මූලධන (රු.මි.)	පුනරාවර්තන (රු.මි)	ව්‍යාපෘති ගණන
වැඩසටහන - 02 (පුරාවිද්‍යා සේවය)				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම			
207-02-02-2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	2.000		1
207-02-02-2002	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	0.500		
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම			
207-02-02-2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	0.500		
207-02-02-2103	යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1.300		
	හැකියා වර්ධනය			
207-02-02-2401	කාර්ය මණ්ඩල පුහුණු	0.500		14
207-02-02-08-2509	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ගවේෂණය, කැණීම් හා පර්යේෂණ**	**2.600**	**25.909**	**75**
	i. ගවේෂණ හා ලේඛන ගත කිරීම්	0.600	15.109	52
	ii. කැණීම්	-	8.125	3
	iii. අභිලේඛන හා නාණක විද්‍යා	2.000	2.675	20
207-02-02-05-2509	**රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපෘතිය**	**10.000**		1
207-02-02-09-2509 (11)	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක සංරක්ෂණය සහ නඩත්තු කිරීම**	**52.000**	**37.844**	**121**
	i. වාස්තුවිද්‍යා සංරක්ෂණ.	27.000	15.41	25
	ii. රසායන සංරක්ෂණ	5.000	3.434	43
	iii. නඩත්තු	20.000	19.000	53
207-02-02-09-2509 (13)	**මහනුවර රජවාසල සංරක්ෂණය (විදේශාධාර)**	**71.000**	**-**	**1**
207-02-02-10-2509	**පුරාවිද්‍යාත්මක ස්ථාන හා ස්මාරක ප්‍රවර්ධනය සහ මහජන ප්‍රදර්ශනය**	**7.500**	**9.899**	**47**
	i. ප්‍රවර්ධන	5.000	5.000	15
	ii. මාධ්‍ය	0.500	0.675	1
	iii. කෞතුකාගාර	2.000	4.224	30
207-02-02-12-2509	**රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය**	**1.000**	-	1
207-02-02-15-2509	**කන්නියා උණු වතුර ළිං පරිශ්‍රය නඩත්තු කිරීම**	**1.000**	-	1
	උප එකතුව	**150.000**	**73.652**	**262**
	මුළු එකතුව	**161.000**	**73.652**	**272**

.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා

.....
ගණන් දීමේ නිලධාරියා

.....
ආයතන ප්‍රධානියා

21

03.පරිච්ඡේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය **ඒසීඒ -එෆ්**

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 (රු.)		සටහන	තත්‍ය (රු.)		
			2022	2021	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,104,020,000	1,035,900,000	ඒසීඒ-3
-	තැන්පතු		64,503,922	19,113,652	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		43,793,644	40,578,539	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	135,896,953	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,212,317,566**	**1,231,489,144**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,212,317,566**	**1,231,489,144**	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඇ)**		**221,982**	**873**	
-	**ශුද්ධ ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඉ= (ඇ)-(ඈ)**		**1,212,095,584**	**1,231,488,271**	
-	**අඩුකළා : වියදම්**				
	පුනරාවර්තන වියදම්				
1,177,050,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	1,021,476,351	925,380,035	
88,450,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	74,498,599	70,663,256	
8,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	4,445,945	4,553,270	ඒසීඒ -2(ii)
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
1,274,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,100,420,895**	**1,000,596,561**	

	මූලධන වියදම්				
5,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	4,769,315	6,870,097	
3,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	3,395,945	11,415,674	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,500,000	හැකියා වර්ධනය	**14**	1,190,334	1,429,065	
103,500,000	වෙනත් මූලධන වියදම්	**15**	76,083,350	100,704,830	
114,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**85,438,944**	**120,419,666**	
-	තැන්පතු ගෙවීම්		64,158,747	42,326,923	**ඒසිඒ-4**
-	අත්තිකාරම් ගෙවීම්		45,634,134	52,832,582	**ඒසිඒ-5**
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්(ඊ)		-	-	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**109,792,881**	**95,159,505**	
1,388,000,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		**1,295,652,720**	**1,216,175,732**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඒ = (ඉ-එ)		**(83,557,136)**	**15,312,539**	
-	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(83,557,136)	15,312,539	**ඒසිඒ-7**
-	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	15,312,539	**ඒසිඒ-3**
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ - පි

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තක්‍ය 2022 (රු.)	2021 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,128,190,722	1,109,669,778
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5 (ඒ)	111,084,342	109,243,852
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**1,239,275,064**	**1,218,913,630**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		38,041,089	36,545,774
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,128,190,722	1,109,669,778
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5 (ආ)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ - 4	73,043,253	72,698,078
අග්‍රිම ශේෂය	ඒසිඒ - 3	-	-
මුළු වගකීම්		**1,239,275,064**	**1,218,913,630**

පිටු අංක 01 සිට 40 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමණුම් පිටු අංක 41 සිට 58 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින්වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී	ගණන් දීමේ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මූල්‍ය)/කොමසාරිස් (මූල්‍ය)
නම:	නම:	නම:
තනතුර:	තනතුර:	
දිනය: 2023.10. 11	දිනය: 2023.10. 13	දිනය: 2023.10. 12

සෝමරත්න විද්‍යානපතිරණ
මේජර්
බුද්ධශාසන ආගමික හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
8 වන මහල
කොළඹ 07

ඒ.ඩී.ඩී. අලුවිහාරි
ප්‍රධාන ගණකාධිකාරි
බුද්ධශාසන අමාත්‍යාංශය
ත්‍රිමහා ව්‍යාපාර පරිපාලන මධ්‍යස්ථානය
කොළඹ 07

24

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය **ඒසිඒ - සී**

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය (රු.)	
	2022	**2021**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	107,133,463	135,896,953
අග්‍රිම ලැබීම්	1,104,020,000	1,035,900,000
අත්තිකාරම් අයකර ගැනීම්	43,736,680	40,578,539
තැන්පතු ලැබීම්	64,503,922	19,113,652
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,319,394,065**	**1,231,489,144**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,100,424,994	993,787,660
සහනාධාර සහ මාරුකිරීම්	4,445,945	4,553,270
වෙනත් ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	25,719,061	19,365,012
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	221,982	873
අත්තිකාරම් ගෙවීම්	46,003,453	51,035,740
තැන්පතු ගෙවීම්	64,158,747	42,326,923
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,240,974,182**	**1,111,069,478**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) =(අ)-(ආ)	**78,419,883**	**120,419,666**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	78,419,883	120,419,666
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**78,419,883**	**120,419,666**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(78,419,883)**	**(120,419,666)**

මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උආ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උආ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

* මූල්‍ය ප්‍රකාශ සටහන් ඉදිරිපත් කර ඇත.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදායම් ශේෂය	එකතු කරන ලද ආදායම (රු.)	
	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අත්තිකාරම් බී ගිණුම 2002-01-01- R	4,471,575.26	46.6
අධිකරණ දඩ මුදල් 2002-02-02-R	22,626,575.00	25.5
සංචාරක බංගලා / නිකේතන 2002-02-02-R	4,600,380.00	283.3
විකුණුම් හා ගාස්තු 2002-02-02-R	19,038,711,.28	35.7

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,274,000,000.00	1,271,719,500.00	1,100,420,895.00	86.53
ප්‍රාග්ධන	114,000,000.00	116,280,500.00	85,438,944.00	73.47

3.7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිසත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රතිපාදනය කරන ලද ප්‍රතිපාදන

ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
		මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය	කන්නියා උණුවතුර ළිං පරිශ්‍රය නඩත්තු කිරීම.	1,500,000.00	2,950,500.00	1,059,413.00	35.10

3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය (රු.)	31.12.2022 දිනට මුල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය (රු.)	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය% ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්		138,320,748.20		
9152	යන්ත්‍රෝපකරණ		78,369,973.89		
9153	ඉඩම්		911,500,000.00		
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

(72)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. CAA/B/DA/133/2022/FA මගේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 මැයි 01 දින

ගණන්දීමේ නිලධාරී,

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 207 - පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 මැයි 09 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ)	දේපළ වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	1.6.1 (ඊ)

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂ එකතුව රු.110,677,158 ක් වූ අතර, ණය පාලන ගිණුමේ ශේෂය රු.111,084,342 ක් විය. ඒ අනුව එම ශේෂ අතර රු.407,184 ක වෙනසක් තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නොමැති සේවකයන්ගෙන් හා නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.3,576,785 ක් වූ ණය ශේෂ අතුරින් වර්ෂ 05 කට වැඩි ණය ශේෂ වල එකතුව රු.1,329,920 ක් විය. එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු සිදුකර පැවති නමුත්, විවිධ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී පැවති බව නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1. වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 07 කට අදාළව සියයට 60 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ රු.12,211,683 ක ප්‍රතිපාදන ඉතිරි වී පැවතිණි.

(ආ) ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පරිගණකගත ලෙජරයේ පවතින Ambassador Fund for Cultural Preservation නම් වූ ලෙජර් ගිණුම යටතේ එකතුව රු.7,125,443 ක්ද, Rajagala Archaeological Reserve – FHSS නම් වූ ලෙජර් ගිණුම යටතේ එකතුව රු.4,971,012 ක්ද සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම තුළ 2014 වර්ෂයේ සිට ඉදිරියට රැගෙන එන ලද එකතුව රු.5,076,893 ක්ද රජගල ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා භාවිතයට නොගෙන 2022 දෙසැම්බර් 31 දින වන විටත් ඌන උපයෝජිතව ගිණුම් තුළ පැවති බව නිරීක්ෂණය විය.

2.2. බැරකම් හා බැඳීම් එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැපැල් දෙපාර්තමේන්තුව සතු ලොරි රථ 03 ක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත 2020 ජූනි 23 දින පවරාගෙන තිබුණ අතර, එම ලොරි රථ තැපැල් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ අධීක්ෂණය හා නිර්දේශයට අනුව දේශීය නියෝජිත ආයතනය වෙතින් මිල ඇස්තමේන්තු කැඳවා රු.4,614,777 ක මුදලකට අළුත්වැඩියාවන් සිදු කිරීම 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර පැවති නමුත්, 2023 මාර්තු 15 විගණන දින දක්වාත් අදාළ බිල්පත් පියවා වාහන 03 දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට නොහැකි වී පැවති බවත්, යථෝක්ත මුදල ගෙවිය යුතු මුදලක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනයේ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුළ ඇතුළත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 207-1-1-0-1301 හා 207-2-2-0-1301 වාහන නඩත්තු වියදම් වැය විෂයයන් යටතේ පිළිවෙලින් වියදම් දරා ඇතැති බිල්පත් වශයෙන් පවතින රු.2,856,215 හා රු.709,283 ක් මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන බැරකම් වශයෙන් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය තුළ හෙළිදරව් කර නොතිබුණි.

2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.4. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීතිරීති හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

නීති රීති රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 104 (3)	WPPG – 4006 දරන කැබ් රථයේ 2018 ඔක්තෝම්බර් 09 දින රාත්‍රී 12.00 ට සිදු වූ හදිසි අනතුර පිළිබඳව පොදු 283 ආකෘතියෙන් ප්‍රාරම්භක වාර්තාව පිළියෙල කර නොතිබීම.

	(ii) මුදල් රෙගුලාසි 104 (4)	WPPG – 4006 දරන කැබි රථයේ 2018 ඔක්තෝම්බර් 09 දින රාත්‍රී 12.00 ට සිදු වූ හදිසි අනතුර පිළිබඳව පොදු 284 ආකෘතියෙන් පූර්ණ වාර්තාව පිළියෙල කර නොතිබුණි.
	(ආ) 2008 ඔක්තෝම්බර් 20 දිනැති අංක 1572/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය	ගැසට් පත්‍රය ප්‍රකාරව හඳුන්වාදී තිබෙන ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ඉටු කර නොමැති බව නිරීක්ෂණය විය.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1. කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 ජනවාරි 18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශ අංක NH/05/2011 මඟින් පුරාවිද්‍යාත්මක ස්ථානවල නඩත්තුව හා කළමනාකරණය සඳහා පුරාවිද්‍යා උරුම කළමනාකරණ භාරය නමින් අරමුදලක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා 2011 පෙබරවාරි 10 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 11/0169/555/004 මඟින් ලබාදුන් අනුමැතිය අනුව මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් උපයනු ලබන ආදායමින් සියයට 25 ක් සංදේශයේ සඳහන් අරමුණු වෙනුවෙන් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශයට ලබාදිය යුතු බව සඳහන් විය. එහෙත් 2022 දෙසැම්බර් 31 දින වනතුරුත් මධ්‍යම සංස්කෘතික අරමුදලට ලැබෙන මුදලින් අදාළ අරමුදල පිහිටුවීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී පැවති බව නිරීක්ෂණය විය.

(ආ) අම්පාර ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවතින නීලගිරිය සෑය ප්‍රතිනිර්මාණ කටයුතු ආරම්භ කර දිගුකාලයක් ගතවී පැවති අතර, විගණන අවස්ථාව වන විට දෙපාර්තමේන්තු ගවේෂණ අංශ නිලධාරීන් විසින් ස්ථූපය හා ඒ ආශ්‍රිත නටඹුන් සංකීර්ණය හඳුනා ගැනීම සඳහා ගවේෂණය සිදු කර අවසන් වී පැවති අතර, රක්ෂිතයක් ලෙස වෙන් කිරීම සඳහා මායිම් නිරවුල් කිරීම සිදුකර පැවති නමුත්, මායිම් කණු යෙදීම හෝ මැනුම් කටයුතු සිදු කර පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ගැසට් කර නොතිබුණි.

(ඇ) රජගල පුරාවිද්‍යා භූමියට අයත් අක්කර 1025 න් පියංගල රක්ෂිතයට අදාළ කොටස ඉවත් කිරීමෙන් පසු ඉතිරි රජගල පුරාවිද්‍යා ව්‍යාපෘතියට අයත් භූමි ප්‍රමාණය දැනට මැනුම් කටයුතු අවසන් කර පැවති නමුත්, 2023 මාර්තු 20 දින දක්වා මායිම් කණු යොදා නොතිබුණු අතර, වෙන් කළ පුරාවිද්‍යා භූමියක් ලෙස මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සකස් කළ ගම් පිඹුරේ සටහන් වී පැවති නමුත්, මෙම පුරාවිද්‍යා භූමිය පුරාවිද්‍යා රක්ෂිතයක් ලෙස ගැසට් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.2. ප්‍රසම්පාදනයන්

රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකට සකස් කිරීම පිළිබඳ උපදෙස් ලබාදුන් මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ අංක PED/e-GP/Circular/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති වක්‍රලේඛයට සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අංක PED/e-GP/Circular/2018 හා 2018 ඔක්තෝම්බර් 23 දිනැති වක්‍රලේඛ සඳහා දෙපාර්තමේන්තුව අනුකූලව කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.3. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභිලේඛන හා නාණක විද්‍යා අංශය මඟින් ප්‍රාදේශීය පුරාවිද්‍යා කෞතුකාගාරයන්හි ඇති පැරණි කාසි 10,950 සුවිගත කර පැවති අතර, ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හා විශාල කාලයක් ගතවීම හේතුවෙන් පුරාවිද්‍යාත්මක විවිධ කැණීම් වලදී හමු වූ වංචල පුරාවස්තු වන පෞරාණික කාසි විශාල ප්‍රමාණයක් තවදුරටත් දෙපාර්තමේන්තුවේ විවිධ අංශ හා ප්‍රාදේශීය කාර්යාල තුළ සංරක්ෂණය හා සුවිගත කිරීමකින් තොරව ගබඩා කර පවතින බව නිරීක්ෂණය විය.

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පාහියන්ගල ලෙනෙහි සිදුකරන ලද කැණීමෙන් හමු වූ මානව අස්ථි අවශේෂ පර්යේෂණ කටයුතු සඳහා කේම්බ්‍රිජ් සරසවියට ගෙන ගොස් පසුව ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ නිබී යළි ශ්‍රී ලංකාවට රැගෙනවිත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත 2022 පෙබරවාරි 11 දින භාරදුන් බවටත්, නමුත් එම අස්ථි අවශේෂ ආරක්ෂිතව තබා ගැනීමට හා විධිමත් පර්යේෂණ කිරීමට සුදුසු රසායනාගාර පහසුකම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු නොවීමත් හේතුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය වෙත ඉහත දිනැති ලිපිය මඟින් නැවත එදිනම භාරදී තිබූ බව නිරීක්ෂණය විය.

3.4. පාඩු හා හානි

PG – 4006 දරන කැබ් රථය 2018 ඔක්තෝම්බර් 09 දින මධ්‍යම රාත්‍රී මහනුවර ගන්නෝරුව ප්‍රදේශයේදී අනතුරට භාජනය වීම හේතුවෙන් වාහනයට සිදු වූ අලාභයේ මූල්‍ය තක්සේරු වටිනාකම වූ රු.5,882,769 ගෙවීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඉහත වටිනාකමින් රාජ්‍ය දේපළකට හානි හා පාඩු සිදු වී පැවති බව නිරීක්ෂණය විය.

3.5. කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2004 මැයි 11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව වැටුප් සකස් කිරීම සඳහා වැටුප් සැකසීමේ මෘදුකාංගය (GPS – Government Payroll System) භාවිතා කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ යාපනය, වවුනියාව හා ත්‍රිකුණාමලය යන ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාත් GPS මෘදුකාංගය භාවිතා කර නොතිබුණි. එසේම වැටුප් සැකසීමේ කාර්යය ප්‍රධාන ගණකාධිකාරීගේ සෘජු අධීක්ෂණය යටතේ මධ්‍යගත ක්‍රමවේදයට අනුව සිදු කළ යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ප්‍රමාණවත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ අනුමත දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා ස්ථාන මාරු ක්‍රමවේදයක් 2017 තෙක්ම පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි. එසේ වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධි විධාන වලට අනුකූලව පිළියෙල කළ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සඳහා 2018 ජූලි 09 දින අනුමැතිය ලබාගෙන තිබුණි. එසේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රමවේදයක් සකස් කර අනුමැතිය ලබාගෙන තිබුණද, එම ක්‍රමවේදයට අනුව ස්ථාන මාරු කිරීම සඳහා නිලධාරීන් හා සේවකයින් තෝරා ගැනීමට ස්ථාන මාරු ඇගයීම් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. එසේම 2019, 2020, 2021 හා 2022 වර්ෂ වලදීද වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි.

(ඇ) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පාලනය හා කළමනාකරණය කරනු ලබන සංචාරක නිවාස 13 සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳව තීරණය කිරීමේදී, පාලන අංශය, ගිණුම් අංශය හා නඩත්තු අංශය නියෝජනය වන පරිදි කමිටුවක් පත් කර එම කමිටු තීරණය මත ගාස්තු සංශෝධනය කළ යුතු වුවද, එසේ කටයුතු නොකර නඩත්තු අංශයේ තීරණය මත පමණක් ගාස්තු සංශෝධනය කර තිබුණි.

(ඈ) 2017/2018 වර්ෂ වලදී නැගෙනහිර පළාත් විශේෂ කාර්යය බලකාය යනුවෙන් බලකායක් පත් කර දෙපාර්තමේන්තුවේද සහය ඇතුව නැගෙනහිර සියළු පුරාවිද්‍යා ස්ථාන හඳුනාගෙන එම ස්ථාන වෙන් කර හඳුනා ගැනීම සඳහා මායිම් කණු දැමීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වී පැවතිණි. එම ව්‍යාපෘතිය සඳහා 2018 වර්ෂයේදී MNT/EP/49/18 ඇස්තමේන්තුව යටතේ රු.7,306,933 ක ප්‍රතිපාදන වෙන් කරගෙන පැවති අතර, 2021 වර්ෂයේදී සැපයුම්කරුට රු.2,626,796 ක් ගෙවීම් කර අඩි 3 හා අඩි 3 ½ මායිම් කණු 1,531 ක් සකස් කර පැවති නමුත්, 2023 මාර්තු 20 විගණිත දින දක්වා අදාළ පුරාවිද්‍යා ස්ථාන වලට මායිම් කණු ස්ථාපිත කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී පැවති බව නිරීක්ෂණය විය.

(ඉ) දීඝවාපි චෛත්‍ය සංරක්ෂණය සඳහා 2013 – 2014 වර්ෂ වලදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ලබාගෙන ඇති ඉංජිනේරු ගඩොල් 377,000 ක් නිසි තාක්ෂණික වාර්තා නොමැතිව මිලදී ගෙන පැවති හෙයින් ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් පැවැත්වීම හා ඒ පිළිබඳ අවසන් තීන්දුවක් ලබාදී නොමැති වීම හේතුවෙන් වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ කාලගුණික විපර්යාස වලට භායනය වෙමින් විශාල ගඩොල් අට්ටි කිහිපයකට වෙන් කර චෛත්‍ය වටා ඇති සලපතල මළුව හා වැලි මළුව ආශ්‍රිතව ගොඩ ගසා පැවති බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඊ) දීඝවාපි දාගැබ ප්‍රතිනිර්මාණය කිරීමේ කාර්යය සඳහා Rotatable arched template එකක් නිෂ්පාදනය කරවා ගැනීම පිණිස පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව අතර 2019 නොවැම්බර් 25 දින ගිවිසුම්ගතව පැවති අතර, මෙම කාර්යය ඉටු කරවා ගැනීම සඳහා වන කොන්ත්‍රාත් වටිනාකම වැට හැර රු.4,147,400 ක් වී පැවතිණි. කාර්යය ආරම්භ කිරීම සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් සියයට 50 කට වඩා වැඩි වූ රු.2,239,596 ක මුදලක් 2020 අගෝස්තු 25 දින හා චෙක්පත් අංක 428281 මඟින් අධ්‍යක්ෂ ජනරාල් රජයේ කර්මාන්ශාලාව වෙත ගෙවා පැවති නමුත්, පසුව එම කාර්යය ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එය මිනුම් උපකරණ මඟින් මිනුම් ලබා ගැනීමේ

ක්‍රමවේදය අනුව සිදු කිරීමට තීරණය තිබුණි. අත්තිකාරම් මුදලක් ගෙවා ඇති හෙයින් සහ අවශ්‍ය යකඩ යම් ප්‍රමාණයක් සකස් කර ඇති හෙයින් චෛත්‍ය ඉදිකිරීමෙන් පසු අවශ්‍ය නඩත්තු කාර්යයන් සිදු කිරීම සඳහා ප්‍රයෝජනයට ගත හැකි, ගලවා ඉවත් කළ හැකි තරප්පු පෙළක් නිම කිරීම සඳහා එම ලෝහ කොටස් භාවිතා කිරීමට යෝජනා කර තිබුණත්, දෙපාර්තමේන්තුව සතුව මුදල් නොතිබියදී නිශ්කාර්යා කටයුතු සඳහා තවදුරටත් කාලය හා මුදල් වැය නොකර එම අත්තිකාරම් මුදල නැවත දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට හෝ එසේ නොමැති නම් අත්‍යාවශ්‍යම ඵලදායී කාර්යයකට එම යකඩ යොදා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

3.6. මෙහෙයුම් අකාර්යක්ෂමතා

දෙපාර්තමේන්තුවේ භාවිතා කරන රථ වාහනවල බඳෙහි රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තු නාමය මුද්‍රිතව සටහන් කර නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

4.1. තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය අතර ඇතිකරගත් ගිවිසුමක් යටතේ ආයතන දෙක අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස 2012 වසරේ සිට ක්‍රියාත්මක වෙමින් පැවති මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.323,897,373 ක් වූ රජගලතැන්න පුරාවිද්‍යා ව්‍යාපෘතිය 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙන් මතුකරගෙන පවතින පුරාවිද්‍යා ස්මාරක නැරඹීම සඳහා දේශීය මෙන්ම විදේශීය සංචාරක ප්‍රවර්ධනය සඳහා අදාළ නියාමන ආයතන සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දීමට අමතරව යෝජිතව පවතින ඉදිකිරීම් කඩිනමින් නිමා කිරීමේ අවශ්‍යතා පවතින නමුත්, ඒ සඳහා විශාල කාල ප්‍රමාදයන් පවතින බවත්, එසේම සංචාරක කර්මාන්තය දියුණු කිරීම උදෙසා ප්‍රධාන සංචාරක සංධිස්ථානයක් ලෙස රජගලතැන්න ස්ථාපිත කිරීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, වන ජීවී දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමේ ක්‍රමවේදයන් සකස් කර ක්‍රියාත්මක කිරීමෙන් රටේ වර්තමානයේ ඇති වී පවතින දැඩි මූල්‍ය අර්බුධයට මූල්‍ය සහනයක් ළඟා කර දීමට රාජ්‍ය අංශයේ යම් දායකත්වයක් ලබාදීම සිදු කළ හැකි බව නිරීක්ෂණය විය.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 මාතර කඹුරුගමුව ඇත් කඳ විහාරයේ අවට සිදු කරන ලද පුරාවිද්‍යා ගවේෂණයේදී විහාරස්ථානයට යාබද පෞද්ගලික ඉඩමේ පුරාවස්තු පරීක්ෂා කිරීමට එම ස්ථානයට ගිය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ රාජකාරියට පුද්ගලික ඉඩමේ හිමිකාරිය බාධා කිරීම සම්බන්ධයෙන් මාතර පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. මේ පිළිබඳව මාතර පොලීසිය විසින් මහේස්ත්‍රාත් අධිකරණයේ අංක 90759 දරන නඩුව පවරා තිබුණි. නඩු විභාගයෙන් පසුව චිත්තිකාරිය නිදොස් කොට නිදහස් කර තිබුණු අතර, චිත්තිකාරිය විසින් මාස 08 ක කාලයක් බන්ධනාගාරගත වීම හේතුවෙන් ඇයට සිදු වූ පාඩුව වෙනුවෙන් එක් අයෙකුගෙන් ලක්ෂ 10 බැගින් වන්දි ඉල්ලා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ නිලධාරියෙකුට හා පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරීන් 02 කුට විරුද්ධව මාතර දිසා අධිකරණයේ අංක M13703 දරන නඩුකරය පවරා තිබුණි.

(ආ) හපුතලේ පොලිස් වසමේ පිහිටා ඇති හල්දුම්මුල්ල සොරගුණේ කතරගම දේවාලය පිහිටි භූමියේ අනවසර කැණීම් සිදු කළ චිත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව හපුතලේ පොලීසිය විසින් බණ්ඩාරවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ 2014 වර්ෂයේ පවරන ලද අංක 63402 දරන නඩුව විභාග කිරීමෙන් පසුව 2014 ජූනි 03 දින චිත්තිකරුවන් නිදොස් කොට නිදහස් කර තිබුණි. පසුව චිත්තිකරුවන් විසින් ඔවුන් බන්ධනාගාරගතව සිටි කාලසීමාවට අදාළව සිදු වූ පීඩාව සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීම සඳහා බණ්ඩාරවෙල දිසා අධිකරණයේ අංක M 4251 දරන නඩුව පවරා තිබුණි. මෙම නඩුවේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෙදෙනෙක්, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, ග්‍රාම නිලධාරීවරයා සහ පන්සලේ ස්වාමීන් වහන්සේ වග උත්තරකරුවන් ලෙස නම් කරමින් එක් අයෙකුගෙන් රුපියල් කෝටි 07 බැගින් වන්දි ඉල්ලා තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1. අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2022 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 4318 ක්ද, තත්‍ය කාර්ය මණ්ඩය 1882 ක්ද වීම නිසා පුරප්පාඩු සංඛ්‍යාව 2476 ක් විය. මෙම පුරප්පාඩු අතර විධායක මට්ටමේ පුරප්පාඩු 39 ක්ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 19 ක්ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 202 ක්ද, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 2216 ක්ද පැවතුණි. මෙම පුරප්පාඩු සඳහා වැඩබලන සහ වැඩ ආවරණ වැනි පදනම් යටතේ සේවකයින් සේවයේ නියුක්ත කර තිබූ අතර, එම තනතුරු සඳහා ස්ථිරව බඳවා ගැනීමට නොහැකි වීම හේතුවෙන් අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 57 ක පුරප්පාඩු පැවතීම නිසා අපේක්ෂිත කාර්යභාරය ඉටු කිරීමේදී විවිධ බාධාවන් ඇතිවී තිබුණි.

(ආ) තවද, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ නිලධාරීන් පිරිසක් විසින් විධායක සේවා ගණයේ (SL-1) බඳවා ගැනීම් පටිපාටිය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධයෙන් අංක SC (FR) 248/2016 ගොනු කර ඇති නඩුකරය 2021 දෙසැම්බර් 08 දින අවසන්ව පැවති නමුත්, විගණන අවස්ථාව දක්වා නඩු තීන්දුව ප්‍රකාශයට පත්කර නොතිබුණු බව නිරීක්ෂණය විය. නමුත්, මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් කරන ලද විමසීමකට අදාළව එම දෙපාර්තමේන්තුව විසින් අංක CCA286/ 2016 (A) හා 2022 ඔක්තෝම්බර් 13 දිනැති ලිපිය මඟින් ඒ බව දන්වා ඇති බවත්, අදාළ බඳවා ගැනීම් පටිපාටියට අනුකූලව බඳවා ගැනීම් සිදු නොකරන ලෙසට අතුරු නියෝගයක් හා එසේම දෙපාර්තමේන්තුව වර්තමානයේ පත්ව ඇති ගැටළුකාරී තත්ත්වය පෙන්වා දෙමින් යථෝක්ත නඩුව මෝසමක් මඟින් නැවත කැඳවීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර පැවති බවත් නිරීක්ෂණය විය.

7. **වෙනත් නිරීක්ෂණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතෙහි පවත්නා ඇතැම් වගන්ති කාලීනව සංශෝධනය නොවීමේ ප්‍රතිඵලයක් ලෙස අයකරනු ලබන දඩ මුදල් ප්‍රමාණවත් නොවන බව විගණනයේ අදහස වේ. යථෝක්ත පනතෙහි වගන්ති උල්ලංඝනය පිළිබඳ මහේස්ත්‍රාත් අධිකරණ වල පවරා ඇති නඩු වලදී ගොණු කරන ලද චෝදනා පත්‍රයට නිවැරදිකරු බව ප්‍රකාශ කර නඩු විභාගය අවසන් වීමෙන් පසු චූදිත / චූදිතයා අදාළ චෝදනා වලින් නිදොස් කොට නිදහස් කිරීමෙන් පසු සද්භාවයෙන් තම රාජකාරිය ඉටු කළ රාජ්‍ය නිලධාරීන්ට එරෙහිව වන්දි ඉල්ලා නඩු පැවරීම වැළැක්වීම සඳහා ප්‍රතිපාදන කිසිවක් පුරාවස්තු ආඥා පනතෙහි නොමැති වීම හේතුවෙන් සමහර අවස්ථා වලදී පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් සහ ස්ථාන පරීක්ෂණයට ගිය නිලධාරීන් වගඋත්තරකරුවන් කර වන්දි ඉල්ලා නඩු පවරා ඇති අවස්ථා විගණනය වෙත නිරීක්ෂණය විය.

(ආ) පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කරන තැනැත්තන් අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීමේ කණ්ඩායමක් පුරාවස්තු ආඥා පනත මඟින් හඳුන්වාදී නොමැති නිසා ආඥා පනත උල්ලංඝනය කරන්නන් අත්අඩංගුවට ගෙන නීතිමය ක්‍රියාමාර්ග ගැනීම බොහෝ අවස්ථා වලදී පොලිසිය මඟින් සිදුකරනු ලබන බවත්, පනතේ යථෝක්ත වගන්තියද සංශෝධනය විය යුතු කරුණක් බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) පුරාවස්තු පනත උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් පුරාවස්තු සොරකම් කිරීම සම්බන්ධව නඩු 07 ක්ද, පුරාවස්තු විනාශය සම්බන්ධයෙන් නඩු 03 ක්ද, පුරාවස්තු අනවසර කැණීම් සම්බන්ධව නඩු 152 ක්ද, පනතට ගැනෙන වෙනත් වැරදි සම්බන්ධව නඩු 11 ක්ද වශයෙන් 2022 දෙසැම්බර් 31 දිනට පැවති සමස්ථ නඩු පැවරීම් සංඛ්‍යාව 173 ක් විය. තවද, විගණිත දිනට අධිකරණයේ විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව 72 ක් වී පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) 1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධන පනතින් සංශෝධනය වූ 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ 46 (1) අනුව ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයන් පැවතීම හේතුවෙන් යටෝක්ත ආඥා පනත යටතේ නඩු පැවරීමෙන් පසු විත්තිකරුවන් වෙත නියම කරනු ලබන දඩ මුදලෙන් අඩක් පුරාවිද්‍යා තෑගි අරමුදලට බැර කළ යුතුය. මේ වන විට සකස් කර ඇති යටෝක්ත රෙගුලාසි ඇතුළත් කෙටුම්පත මඟින් නීති කෘත්‍යයන්හි නිරත වන වැටලීම් නිලධරයන්, පොලිස් නිලධරයන් හෝ වෙනත් යම් රාජ්‍ය ආයතනක හෝ පළාත් පාලන ආයතනයක යම් නිලධරයන්ට සියයට 30 ක ප්‍රතිශතයක් ලබාදීම සඳහා විධි විධාන සලසා පැවති නමුත්, අදාළ රෙගුලාසි ඇතුළත් කෙටුම්පත පුරාවස්තු ආඥා පනතේ 47 (3) ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත්, එහි ප්‍රමාදයක් පැවතීම හේතුවෙන් විශේෂයෙන්ම පොලිස් නිලධාරීන් ඉල්ලනු ලබන තෑගි අරමුදල් ප්‍රතිශත ඔවුන් වෙත ලබාදීමට නොහැකි තත්ත්වයක් උදා වී පැවති බවත්, ඒ පිළිබඳ පොලීසිය දැඩි අප්‍රසාදය පල කර ඇති අතර පුරාවස්තු ආඥා පනත උල්ලංඝනය කරන්නන් නීතියේ රැහැනට අසු කර ගැනීම සඳහා බොහෝ අවස්ථා වලදී සම්බන්ධ වන්නේ පොලිස් නිලධාරීන් බවත්, ඔවුන් දිරිමත් කිරීම සඳහා ත්‍යාග වශයෙන් යෝජනා කර ඇති මුදල් ප්‍රතිශතය ඔවුන්ට ලබා නොදීම හේතුවෙන් විවිධාකාරයෙන් අක්‍රමිකතාවයන් සිදු වී පැවති බවත් විගණනය වෙත ඉදිරිපත් කළ ලිඛිත තහවුරු කිරීම් මඟින් නිරීක්ෂණය විය.

එච්.එම්.රණසිංහ මුණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04. පරිච්ඡේදය

කාර්යසාධන දර්ශකය

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශකය		අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
1	සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන		√	
2	ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන	√		
3	නඩත්තු කර පවත්වා ගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන	√		

05.පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

11. තිරසර නගර සහ ප්‍රජාවන්

11.4.1 ප්‍රධාන කාර්ය සාධක දර්ශක

1. සංරක්ෂණය කරන ලද ගොඩනැගිලි ඒකක ගණන.
2. ගවේෂණය කරන ලද පුරාවිද්‍යා ස්ථාන ගණන.
3. නඩත්තු කර පවත්වාගෙන යන ස්ථාන සහ ස්මාරක වැඩ බිම් ඒකක ගණන.

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0%-49%	50% - 74%	75% - 100%
11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	**1.1**	**විශ්වීය වැදගත්කමක් ඇති පුරාවිද්‍යා ස්ථාන ලෝක උරුම තත්ත්වයට උත්ශ්‍රේණි කිරීම.**				
	1.1.1	2030 වන විට පුරාවිද්‍යා ස්ථානයක් ලෝක උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.	ස්ථාන ගණන	මෙහි කටයුතු සිදු කරමින් පවතී.		
	1.2	**පුරාවිද්‍යා ස්ථාන නියමු සැලසුම් තුළ හඳුනා ගෙන ඇති වැඩසටහන් තුළින් ප්‍රශස්ත මට්ටමට ගැනීම.**				
	1.2.1	නියමු සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම - (වර්ෂයකට 05)	පුරාවිද්‍යා ස්ථාන ගණන		√	
	1.3	**ගවේෂණය කිරීම / ගැසට් කරනු ලබන පැරණි පුරාවිද්‍යා ස්මාරක සහ ස්ථාන වැඩි කිරීම.**				
	1.3.1	ආරක්ෂිත ස්මාරක සහ රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම - (ආරක්ෂිත ස්මාරක වර්ෂයකට 100 / වෙන් කළ ප්‍රදේශ 25)	ආරක්ෂිත ස්මාරක සහ රක්ෂිත			√
	1.3.2	උරුම කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස්කිරීම.	රැස් කරන දත්ත ප්‍රතිශතය		√	
	1.3.3	පුරාවිද්‍යා ස්ථාන නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම.	ප්‍රකාශිත පුරාවිද්‍යා ස්ථාන			√
	1.3.4	දෛනික ක්ෂේත්‍ර කටයුතු සිදු කිරීම.	ගවේෂණ කරන ලද ස්ථාන			√
	1.3.5	චංචල පුරාවස්තු ලේඛන ගත කිරීම.	ලේඛන ගත කරන ලද පුරාවස්තු		√	

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0%-49%	50% - 74%	75% - 100%
11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	**1.4**	**ප්‍රජාව, පාසැල් සහ විශ්වවිද්‍යාල ළමුන්ගේ සහභාගිත්වයෙන් ස්ථාන ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.**				
	1.4.1	ස්ථානීය දැනුවත් කිරීමේ වැඩමුළු - (ස්ථාන ගණන වසරකට 15)	පැවැත්වූ වැඩමුළු		√	
	1.4.2	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා අධ්‍යාපන ආයතන සඳහා පුරාකුටි පිහිටුවීම.	පුරාකුටි සංඛ්‍යාව	-		
	1.4.3	පාසැල් හා විශ්වවිද්‍යාලවලට පුරාවිද්‍යා ස්ථාන රූකබලා ගැනීමට බාරදීම - (වසරකට 60)	ස්ථාන සංඛ්‍යාව	-		
	1.4.4	ශ්‍රමදාන පැවැත්වීම - (වසරකට 30)	පැවැත් වූ ශ්‍රමදාන		√	
	1.5	**දෙස් විදෙස් ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන්.**				
	1.5.1	ජංගම ප්‍රදර්ශන පැවැත්වීම - (වසරකට 30)	පැවැත්වූ ප්‍රදර්ශන		√	
	1.5.2	ග්‍රන්ථ මුද්‍රණය - (වසරකට 10)	මුද්‍රණය කළ ග්‍රන්ථ			√
	1.5.3	දේශන පැවැත් වීම - (වසරකට 100)	පැවැත් වූ දේශන		√	
	1.5.4	වීඩියෝ වැඩසටහන් සකස් කිරීම - (වසරකට 25)	සකස් කළ වීඩියෝ වැඩ සටහන්			√
	1.5.5	සන්නිවේදන කටයුතු ප්‍රවර්ධනය.	වැඩ සටහන් සංඛ්‍යාව	-		
	1.5.6	පුස්තකාලවලට ග්‍රන්ථ මිලදී ගැනීම - (වසරකට 200)	මිලදී ගත් ග්‍රන්ථ	-		
	1.5.7	කෞතුකාගාර 28 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	නඩත්තු කරන ලද කෞතුකාගාර			√
	1.5.8	සංචාරක මහ පෙන්වන්නන්ගේ දැනුම වැඩි කිරීම. (සංචාරක මණ්ඩලයේ ඉල්ලීම් අනුව සම්පත් දායකත්වය සැපයීම)	වැඩ සටහන් සංඛ්‍යාව	-		
	1.6	**පුරාවස්තු ස්ථාන හා ස්මාරක නඩත්තු කිරීම. (වසරකට 200 පමණ)**				
	1.6.1	පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක ආරක්ෂා කිරීම සහ ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාම - කලාප 96 (වැඩබිම් 200 පමණ).	නඩත්තු කරන ලද ස්මාරක			√
	1.6.2	පුරාවිද්‍යා ස්මාරක නඩත්තු කිරීම - (වසරට 50)	ප්‍රතිසංස්කරණය කළ ස්මාරක			√

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0%-49%	50% - 74%	75% - 100%
11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	1.6.3	මායිම් කණු යෙදීම.	මායිම් කණු යෙදූ ස්ථාන සංඛ්‍යාව			√
	1.6.4	පුරාවිද්‍යා ස්ථාන ප්‍රවර්ධනය සඳහා විස්තර පුවරු, මාර්ගෝපදේශ පුවරු, ආරක්ෂිත ස්මාරක පුවරු, අනතුරු ඇඟයීමේ පුවරු සවි කිරීම - (වසරකට 200)	යෙදූ පුවරු සංඛ්‍යාව			√
	1.6.5	පුරාවිද්‍යා ස්ථාන සඳහා සනිපාරක්ෂක සහ යටිතල පහසුකම් සැපයීම - (වසරකට 05)	ස්ථාන සංඛ්‍යාව			√
	1.6.6	විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට අවශ්‍ය පහසුකම් සැලසීම.	ස්ථාන සංඛ්‍යාව	-		
	1.6.7	කලාප 96 ක් නඩත්තු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම.	මිලදී ගත් උපකරණ	-		
	1.7	**පුරාවිද්‍යා පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.**		-		
	1.7.1	කැණීම් - (වසරකට 10)	ක්‍රියාත්මක ව්‍යාපෘති		√	
	1.7.2	ක්ෂේත්‍ර ගවේෂණ හා ලේඛණගත කිරීම් - (වසරකට 20)	ක්‍රියාත්මක ව්‍යාපෘති			√
	1.7.3	අභිලේඛණ හා නාණක විද්‍යා - (වසරකට 10)	ක්‍රියාත්මක ව්‍යාපෘති			√
	1.8	**දෙපාර්තමේන්තු යටිතල පහසුකම් - (ස්ථාන, කළමනාකරණ, භෞතික සම්පත්, ගොඩනැගිලි, කාර්යාල මෙවලම්)**				
	1.8.1	නව රසායනාගාර ඉදිකිරීම - (වසරකට 1)	ඉදිකළ රසායනාගාර			√
	1.8.2	පැරණි රසායනාගාර නවීකරණය කිරීම.	නවීකරණය කළ රසායනාගාර			√
	1.8.3	නිල නිවාස 1 නඩත්තු කිරීම හා නිලධාරීන් සඳහා නව නිල නිවාස ඉදිකිරීම.	නඩත්තු කරන ලද හා ඉදිකළ නව නිල නිවාස		√	
	1.8.4	කාර්යාල ගබඩා පහසුකම් හා නව කලාප කාර්යාල ඉදිකිරීම - (වසරකට 3)	ඉදිකරන ලද කලාප කාර්යාල		√	
	1.8.5	වෙනත් - ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය කාර්යාල, සංචාරක බංගලා, කෞතුකාගාර අන්තර්ගතව ගොඩනැගිලි 100 ක් නඩත්තු කර පවත්වා ගෙන යාම.	නඩත්තු කරන ලද ගොඩනැගිලි			√

ඉලක්කය / අරමුණ	ඉලක්ක		ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය.		
				0%-49%	50% - 74%	75% - 100%
11.4 රටේ ස්වාභාවික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂා කර ගැනීම හා ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම.	1.8.6	සියලුම සංචාරක බංගලා (15) සඳහා පහසුකම් සැපයීම.	සංචාරක බංගලා සංඛ්‍යාව			√
	1.8.7	නව සංචාරක බංගලා ඉදිකිරීම - (යාපනය, කතරගම, පඩුවස්නුවර)	නව සංචාරක බංගලා		√	
	1.9	**පුරාවිද්‍යා ස්ථාන සහ ස්මාරක සංරක්ෂණය.**				
	1.9.1	වාස්තු විද්‍යා සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂණය කරන ලද ස්මාරක			√
	1.9.2	රිටිගල පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණය - (බන්දා පොකුණ	සංරක්ෂණය කරන ලද ප්‍රතිශතය			√
	1.9.3	රසායන සංරක්ෂණ - (වසරකට 50)	සංරක්ෂණය කරන ලද ස්මාරක			√
	1.9.4	රජගලතැන්න පුරාවිද්‍යා ස්ථානය සංරක්ෂණ ව්‍යාපෘතිය.	සංරක්ෂණය කරන ලද ප්‍රතිශතය			√
	1.10	**පුරාවස්තු අඥාපනත සංශෝධනය කිරීම** - පුරාවස්තු අඥා පනතට අදාළව සිදු කරන ලද සංශෝධන	පනතට සිදු කරන ලද සංශෝධන			√

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ඕනෑම රටක සමාජයක කවර අන්දමේ ආර්ථික වර්ධනයකදී වුව එහි සංස්කෘතියෙන් වෙන් කළ නොහැකි බව පසුගිය කාලය තුළ ලෝක ප්‍රජාව ලැබූ අත්දැකීම් පසක් කරමින් තිරසර සංවර්ධන ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී සංස්කෘතික හා ස්වාභාවික උරුමයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇත.

ජාතික ප්‍රතිපත්තීන්ට අනුගත වෙමින් සමස්ත ශ්‍රී ලාංකිය උරුමය ආරක්ෂා කිරීම අරමුණු කොට ආරක්ෂිත ස්මාරක හා පුරාවිද්‍යා රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක භූගෝලීය දත්ත ගොණු සැකසීම හා උරුම කළමනාකරණය සඳහා නිවැරදි අවකාශීය දත්ත රැස් කිරීම, පුරාවිද්‍යාත්මක උරුමයන් ලේඛනගත කිරීම, පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ මහජන දැනුම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක / වංචල පුරාවස්තු සංරක්ෂණය හා නඩත්තු කර පවත්වා ගෙන යාම, ප්‍රජා සහභාගිත්වයෙන් ශ්‍රමදාන කටයුතු සංවිධානය කිරීම, රුක්රෝපණ හා වගා වැඩසටහන් ක්‍රියාවට නැංවීම, පාරිසරික අංග සහ භූ දර්ශනය සැකසීම හා පුරාවිද්‍යා ස්ථාන ප්‍රදර්ශනාත්මක මට්ටමින් පවත්වා ගෙන යාම, ගවේෂණ හා පර්යේෂණ සිදු කිරීම මඟින් අනාගතය සඳහා වාර්තා කිරීම හා සංරක්ෂණයට පියවර ගැනීම යන වැඩසටහන් යටතේ ව්‍යාපෘති ක්‍රියාවට නංවමින් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සැලකිය යුතු කාර්යභාරයක් 2022 වර්ෂය තුළ සිදු කරන ලදි. එසේම පුරාවිද්‍යා ස්මාරක

2,773 ක් හා පුරාවිද්‍යා රක්ෂිත 175 ක් 2022 වර්ෂය අවසාන වන විට දිවයින පුරා ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇත.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් ලේඛනගත කර ඇති ආරක්ෂිත ස්මාරක හා වෙන් කළ පුරාවිද්‍යා තහනම් ඉඩම් හා පුරාවිද්‍යා රක්ෂිත පිළිබඳ සංඛ්‍යාත්මක විස්තර

අනු අංකය	පළාත	දිස්ත්‍රික්කය	පුරාවිද්‍යා ස්මාරක සංඛ්‍යාව	පුරාවිද්‍යා තහනම් ඉඩම් සංඛ්‍යාව
1	උතුරු මැද පළාත	අනුරාධපුර	160	45
2		පොළොන්නරුව	35	10
3	දකුණු පළාත	ගාල්ල	89	
4		මාතර	68	3
5		හම්බන්තොට	74	10
6	මධ්‍යම පළාත	මහනුවර	305	11
7		නුවරඑළිය	85	
8		මාතලේ	58	22
9	ඌව පළාත	බදුල්ල	136	3
10		මොණරාගල	137	5
11	බස්නාහිර පළාත	කොළඹ	105	2
12		කළුතර	63	1
13		ගම්පහ	183	
14	වයඹ පළාත	කුරුණෑගල	309	22
15		පුත්තලම	42	3
16	සබරගමුව පළාත	රත්නපුර	130	7
17		කෑගල්ල	180	6
18	උතුරු පළාත	යාපනය	62	4
19		කිළිනොච්චි	8	
20		වව්නියාව	29	1
21		මන්නාරම	33	
22		මුලතිව්	88	2
23	නැගෙනහිර පළාත	අම්පාර	354	2
24		ත්‍රිකුණාමලය	3	3
25		මඩකලපුව	37	13
එකතුව			**2,773**	**175**

පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරකයන්හි ආරක්ෂාව තහවුරු කෙරෙන පුරාවස්තු ආඥා පනතෙහි පුරාවස්තු විනාශය වැළැක්වීමේ හා ක්ෂේත්‍රයේ පැවැත්ම හා ප්‍රවර්ධනයට අදාළ කටයුතු ද 2022 වර්ෂය තුළ සිදු කරන ලදි. 1998 අංක 24 දරන පුරාවස්තු (සංශෝධන) පනතේ 04 වන වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට එක් කර ඇති 15(ආ) වගන්තිය යටතේ පුරාවස්තු විනාශ කිරීම් සම්බන්ධව චෝදනා වීම් 74 ක් විය. පුරාවස්තු

ආරක්ෂණ විශේෂ පොලිස් ඒකකය වෙත පනත උල්ලංගනය වීම් 175 ක් වාර්තා වී ඇති අතර, අත් අඩංගුවට පත් සැකකරුවන් ගණන 638 ක් විය. ඒ අනුව 2022 වර්ෂයේ අයකර ගන්නා ලද දඩ මුදල රුපියල් 24,006,250 කි.

පරිපාලන දිස්ත්‍රික්ක අනුව පුරාවස්තු වැරදි පිළිබඳ සංසන්දනාත්මක වාර්තාව 2022-2021

අනු අංකය	පරිපාලන දිස්ත්‍රික්කය	2021					2022				
		පුරාවස්තු සොරකම්	පුරාවස්තු විනාශය	පුරාවස්තු සෙවීමට අනාවරණ කැණීම්	පනතට ගැනෙන වෙනත් වැරදි	එකතුව	පුරාවස්තු සොරකම්	පුරාවස්තු විනාශය	පුරාවස්තු සෙවීමට අනාවරණ කැණීම්	පනතට ගැනෙන වෙනත් වැරදි	එකතුව
1	අනුරාධපුර	-	7	37	4	**48**	2	3	35	3	**43**
2	පොළොන්නරුව	-	-	6	-	**6**	-	-	3	-	**3**
3	පුත්තලම	-	1	10	2	**13**	-	-	7	-	**7**
4	කුරුණෑගල	-	2	18	1	**21**	-	-	12	1	**13**
5	කොළඹ	-	1	2	-	**3**	-	-	3	-	**3**
6	කළුතර	-	1	9	-	**10**	1	-	4	-	**5**
7	ගම්පහ	-	-	8	-	**08**	-	-	2	-	**2**
8	මන්නාරම	-	-	-	-	**-**	-	-	1	-	**1**
9	වව්නියාව	-	-	2	2	**04**	-	-	1	-	**1**
10	යාපනය	-	-	-	-	**-**	-	-	-	-	**-**
11	කිළිනොච්චි	-	-	-	-	**-**	-	-	-	-	**-**
12	මුලතිව්	-	-	1	1	**2**	-	-	2	-	**2**
13	මාතර	-	-	2	-	**2**	-	-	1	-	**1**
14	ගාල්ල	-	-	2	-	**2**	-	-	2	-	**2**
15	හම්බන්තොට	-	-	16	1	**17**	-	-	7	-	**7**
16	රත්නපුර	1	-	4	-	**5**	1	1	5	-	**7**
17	කෑගල්ල	-	-	2	-	**2**	1	-	6	-	**7**
18	අම්පාර	-	1	11	-	**12**	-	2	15	-	**17**
19	ත්‍රිකුණාමලය	-	1	10	1	**12**	-	-	6	1	**7**
20	මඩකලපුව	-	1	-	-	**1**	-	-	1	1	**2**
21	මහනුවර	1	-	12	3	**16**	2	-	6	-	**8**
22	මාතලේ	-	-	11	-	**11**	-	-	10	-	**10**
23	නුවරඑළිය	-	-	5	-	**5**	-	-	1	-	**1**
24	මොණරාගල	-	-	11	-	**11**	-	-	10	-	**10**
25	බදුල්ල	1	-	20	-	**21**	-	-	15	1	**16**
එකතුව		**3**	**15**	**199**	**15**	**232**	**7**	**6**	**155**	**7**	**175**

ස්වාභාවික හා නීතිවිරෝධි මානව ක්‍රියාකාරකම්වලින් පුරාවස්තූන් ආරක්ෂා කර ගැනීම, සීමිත මූල්‍ය හා භෞතික සම්පත්, කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම, දෙපාර්තමේන්තුව සතු ප්‍රමාණවත් වාහන සංඛ්‍යාවක් නොමැති වීම සහ ක්ෂේත්‍රගතව බොහෝ විට රජකාරී කටයුතු සඳහා පැරණි වාහන යෙදවීමේ දී නිතර අලුත් වැඩියා කටයුතු කිරීමට සිදු වීමෙන් වාහන නඩත්තුව සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වීම මෙහිදී අභියෝග ලෙස දැක්විය හැකිය.

පුරාවිද්‍යාත්මක උරුමය නිසි කළමනාකරණය කිරීම තුළින් ආගමික උරුමයන් සුරක්ෂිත වීම මෙන්ම ප්‍රාදේශීයව යහපත් සමාජ වටපිටාවක් නිර්මාණය වීමට හේතුවන අතර, පුරාවිද්‍යා ස්ථාන හා ස්මාරක නැරඹීම සඳහා දේශීය හා විදේශීය සංචාරකයින් ගේ පැමිණීම ඉහළ යාමට ද ඒ ආශ්‍රිත සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති වීම මගින් ප්‍රජාවේ සමාජ හා ආර්ථික මට්ටම් ඉහළ යාම තුළින් රටේ ආර්ථික සංවර්ධනයට දක්වනු ලබන දායකත්වය ඉමහත් වේ.

06.පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 2022.12.31 දිනට

තනතුර අයත් මට්ටම	අනුමත කාර්යය මණ්ඩලය	තත්‍ය කාර්යය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව
විධායක මට්ටම	54	15	39
තෘතීයික මට්ටම	56	37	19
ද්විතියික මට්ටම	783	621	202
ප්‍රාථමික මට්ටම	3,425	1,209	2,216
එකතුව	**4,318**	**1,882**	**2,476**

6.2. **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

❖ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත සේවා ගණයේ නිලධාරීන් පිරිසක් විසින් විධායක සේවා ගණයේ (SL-1) බඳවා ගැනීම් පටිපාටිය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම කඩවීමක් සම්බන්ධයෙන් ගොනුකර ඇති අංක SC(FR)248/2016 නඩුවෙහි තීන්දුව ලබා නොදීම හා බඳවා ගැනීම් පටිපාටිය අනුව බඳවා ගැනීම් සිදු කළ නොහැකි වීම හේතුවෙන් දෙපාර්තමේන්තුගත විධායක මට්ටමේ තනතුරු සියල්ලම පුරප්පාඩුව පවතින අතර තාවකාලික පිළියමක් ලෙස රාජකාරී ඉටු කිරීම / වැඩ ආවරණය කිරීමේ පදනමින් ඊට පහළ මට්ටමේ නිලධාරීන් සේවයේ යොදවා ඇත. දෙපාර්තමේන්තුව පත්ව ඇති ගැටළුකාරී තත්ත්වය පෙන්වා දෙමින් මෙම නඩුව මෝසමක් මඟින් නැවත කැඳවීමට කටයුතු කරන ලෙසට ඉල්ලීමක් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

❖ කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2020 අනුව ප්‍රාථමික සේවා ගණයේ සියලු බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති අතර එම තනතුරු සඳහා අවශ්‍ය සේවක පිරිස් බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව මඟින් ලබා ගන්නා ලෙස දන්වා ඇත. එහෙත්, දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 3,424 වාර්තා වී තිබූ නමුත් ඒ සඳහා බහුකාර්ය දෙපාර්තමේන්තුවෙන් ප්‍රමාණවත් සේවක පිරිසක් නොලැබුණු අතර, 1,158 ක පුහුණුලාභීන් ප්‍රමාණයක් දැනට සේවයේ යෙදී සිටිති.

❖ එමෙන්ම, ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් නතර කර ඇති හෙයින් පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනිම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට මුදල් අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් යොමු කර ඇතැත්, ඒ සඳහා අනුමැතිය ලැබී නොමැති බැවින් බඳවා ගැනීම් සිදු කළ නොහැකී වී ඇත.

❖ මෙම දෙපාර්තමේන්තුවේ පවතින නිලධාරී ඌනතාවය නිසා සංවර්ධන කාර්යයන් විධිමත්ව ඉටු කිරීම සහ පුරාවිද්‍යාත්මක උරුමයන් සුරැකීම සම්බන්ධ ගැටළු බොහෝමයක් මතු වී ඇති බැවින් මෙම තනතුරු සම්පූර්ණ කිරීමේ කඩිනම් අවශ්‍යතාව පැන නැඟී ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	පුහුණු වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාලසීමාව	සමස්ථ ආයෝජනය (දේශීය රුපියල්)	වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
1.	ආකල්ප සංවර්ධන පුහුණුව	55	දින 01	12,190.00	දේශීය	සඵලදායී කාර්යක්ෂම රාජ්‍ය සේවයක් ලබා ගැනීම ආයතනය තුළ නිලධාරීන් අතර සහයෝගීතාව වර්ධනය කර ගැනීම.
2.	ලෝහ පුරාවස්තු සංරක්ෂණය පිළිබඳ පුහුණුව	60	දින 02	24,575.00	දේශීය	නිලධාරීන් හා කාර්ය මණ්ඩල වෙත පුහුණුව ලබා දීම තුළින් පුරාවස්තු විනාශ වීමකින් තොරව ආරක්ෂා කර ගැනීම.
3.	කළමනාකරණය හා සැලසුම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	15	දින 01	17,635.00	දේශීය	පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නියුතු කළමනාකරණ කටයුතුවල යෙදෙන නිලධාරීන්ගේ දැනුම, කුසලතා වර්ධනය හා නව දැනුම ලබාදීම.
4.	වැඩබිම් කළමනාකරණය සහ නියමු සැලසුම් සකස් කිරීම	35	දින 01	37,600.00	දේශීය	නව වැඩබිමක් සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා පාලනය කිරීම සම්බන්ධව පුළුල් දැනුමක් නිලධාරීන්ට ලබාදීම.
5.	දෙපාර්තමේන්තු රෙගුලාසි හා ක්ෂේත්‍ර පුරාවිද්‍යා මූලධර්ම පිළිබඳ දැනුවත් කිරීම	20	දින 01	20,335.00	දේශීය	දෙපාර්තමේන්තු චක්‍රලේඛ, ස්ථාවර නියෝග, පුරාවිද්‍යා ආඥා පනත හා සංශෝධන, සංස්කෘතික දේපල පනත පිළිබඳ අවබෝධය ලබාදීම. ගවේෂණ හා කැණීම් මූලධර්ම, පුරාවිද්‍යා ආචාරධර්ම පද්ධතිය, ක්ෂේත්‍ර පුරාවිද්‍යාව හා සම්බන්ධිත දේශීය හා අන්තර් ජාතික පනත් ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත් කිරීම.

6.	ඵලදායිතා විෂය පිළිබඳව දැනුවත් කිරීමේ පුහුණුව	63	දින 01	12,505.00	දේශීය	ඵලදායී කාර්යාල පරිසරයක් ගොඩනැගීම, කාර්ය මණ්ඩලය කාර්යක්ෂම සේවාවක් කෙරේ යොමුකිරීම. ඉටු කරනු ලබන කාර්යයන් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකිරීමට ක්‍රමවේද සැකසීමට යොමු කිරීම.
7.	වැටුප් පද්ධතිය සකස්කිරීම පිළිබඳ පුහුණුව	02	දින 03	30,000.00	දේශීය	කාර්ය මණ්ඩලයේ වැටුප් සකස් කිරීමේ පද්ධතිය නිවැරදිව පවත්වා ගැනීම සම්බන්ධයෙන් නිලධාරීන්ට පුහුණුව ලබාදීම.
8.	පාලන මුදල් හා විනය හා දෙපාර්තමේන්තු කාර්යභාරය පිළිබඳ රත්නපුර දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා සහායක කණ්ඩායම දැනුවත් කිරීම	40	දින 01	35,623.00	දේශීය	ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් දැනුවත් විය යුතු කරුණු පිළිබඳව දැනුවත් කිරීම හා විනය සම්බන්ධ අවබෝධයක් ලබාදීම.
9.	පාලන මුදල් හා විනය හා දෙපාර්තමේන්තු කාර්යභාරය පිළිබඳ කෑගල්ල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යා සහායක කණ්ඩායම දැනුවත් කිරීම	50	දින 01	45,910.00	දේශීය	ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි සම්බන්ධයෙන් දැනුවත් විය යුතු කරුණු පිළිබඳව දැනුවත් කිරීම හා විනය සම්බන්ධ අවබෝධයක් ලබාදීම.
10.	ගඩොල් ස්මාරක සංරක්ෂණය පුහුණු වැඩසටහන	25	දින 02	18,625.00	දේශීය	ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ විසිරී පවතින ගඩොල් ස්මාරක සංරක්ෂණය නඩත්තුව හා තහවුරු කිරීම හා නිපුණතාවයෙන් හෙබි පිරිසක් බිහිකර ගැනීම.
11.	රසායන සංරක්ෂණ ව්‍යාපෘති කළමනාකරණය (බිතුසිතුවම්/මූර්ති) පුහුණුව කෑගල්ල දිස්ත්‍රික්කය	14	දින 02	32,735.00	දේශීය	රසායන සංරක්ෂණ අංශයේ කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්කවල සිටින කාර්ය මණ්ඩලය සඳහා කාර්ය පටිපාටි නිර්ණායක හඳුන්වාදී ඒ අනුව රසායන ඇස්මේන්තු සැකසීම පිළිබඳව අවබෝධය ලබාදීම.

12.	රසායන සංරක්ෂණ ව්‍යාපෘති කළමනාකරණය (බිතුසිතුවම්/මූර්ති) පුහුණුව වයඹ පළාත	18	දින 03	63,435.54	දේශීය	රසායන සංරක්ෂණ අංශයේ වයඹ පළාත තුළ සිටින කාර්ය මණ්ඩලය සඳහා කාර්ය පටිපාටි නිර්ණායක හඳුන්වාදී ඒ අනුව රසායන ඇස්මේන්තු සැකසීම පිළිබඳව අවබෝධය ලබාදීම.
13.	ප්‍රසම්පාදන ක්‍රමවේදය	50	දින 01	29,630.00	දේශීය	ප්‍රසම්පාදන කටයුතු හා සම්බන්ධ ගැටළු අවම කර ගැනීම, ඇතිවන ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා කටයුතු කිරීම හා වවුචර්පත් නිවැරදිව ඉදිරිපත් කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදීම.
14.	අස්පර්ශිත උරුමය, ආහාර සංස්කෘතිය පිළිබඳව කෙරෙන විස්තරාත්මක පුහුණු වැඩමුළුව	60	දින 01	64,560.00	දේශීය	අසඳෘශ්‍ය උරුමය යටතේ ආහාර සංස්කෘතිය පිළිබඳ දැනුම හා ආශ්වාදය වර්ධනය කිරීම.
15.	පුරාවස්තු අස්ථානගත වීම වැළැක්වීම හා පුරාවස්තු ලේඛන ගත කිරීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණුව	50	දින 01	40,030.00	දේශීය	දිනෙන් දින සිදුවන පුරාවස්තු සොරකම හා මංකොල්ලය සම්බන්ධයෙන් ජාතික හා ජාත්‍යන්තර අවබෝධය ලබා ගැනීම හා ඒ සම්බන්ධව කටයුතු කරන ආයතනවල අත්දැකීම් හුවමාරු කර ගැනීම.
16.	කාර්යාල ක්‍රම/ පුරාවිද්‍යා ශාස්ත්‍රීය දැනුම හා උරුම කළමනාකරණයේ ප්‍රායෝගික භාවිතය	150	දින 02	19,410.00	දේශීය	පුරාවිද්‍යා වැඩබිම තුළ පාලන හා කළමනාකරණ ක්‍රමවේද ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම හා පුරාවිද්‍යාව පිළිබඳව ශාස්ත්‍රීය දැනුම පුළුල් කිරීම.
17.	MN-05 සේවා ගණය සඳහා බඳවා ගන්නා ලද නවක නිලධාරීන් සඳහා වන මූලික පුහුණු වැඩසටහන	19	දින 06	79,115.00	දේශීය	දෙපාර්තමේන්තුව වෙත බඳවාගත් නවක නිලධාරීන්ගේ කළමනාකරණ හා මූල්‍ය දැනුම යාවත්කාලීන කිරීම
18.	ඉදිකිරීම් කර්මාන්තය සඳහා දැව භාවිතය	10	දින 01	40,000.00	දේශීය	ඉදිකිරීම් කටයුතු සඳහා දැව භාවිතා කිරීමේ දී ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අවබෝධය ලබා දීම.

19.	පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	01	දින 01	4,000.00	දේශීය	පෞද්ගලික ලිපිගොනු නිසියාකාරව පවත්වා ගැනීම පිළිබඳ අවබෝධය ලබා දීම.
20.	රා.ප.ව. 18/2020 අනුව පැය 100 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	81	පැය 100	75,000.00	දේශීය	දෙමළ භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර නොගත් ප්‍රාථමික මට්ටමේ සේවකයින් සඳහා දැනුම ලබා දීම.
21.	මුදල් රෙගුලාසි, මූල්‍ය කටයුතු හා ලිපි ගොනුකරණය	75	දින 01	72,000.00	දේශීය	මුදල් රෙගුලාසිවලට අනුව නිවැරදිව වවුචර් ඉදිරිපත් කිරීම පිළිබඳ පුහුණුව ලබා දීම.
22.	පුරාවිද්‍යාත්මක කටයුතු වල කාලීන හා සමාජීය ගැටළු පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණුව	55	දින 02	75,395.00	දේශීය	පුරාවිද්‍යාත්මක කටයුතුවලදී ඒවා සිදු කරන ආකාරය පිළිබඳව සහ එහිදී මුහුණ දෙන ගැටළු පිළිබඳව දැනුම යාවත්කාලීන කිරීම.
23.	රා.ප.ව. 18/2020 අනුව පැය 200 දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	01	පැය 200	15,000.00	දේශීය	දෙමළ භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා දැනුම ලබා දීම.
24.	කැන්වස් චිත්‍ර සංරක්ෂණ පුහුණු පාඨමාලාව	40	දින 01	43,550.00	දේශීය	රසායන සංරක්ෂණ අංශයේ කැන්වස් චිත්‍ර සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධය ලබාදීම.
25.	ගිණුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන	80	දින 01	20,000.00	දේශීය	මුදල් රෙගුලාසිවලට අනුව නිවැරදිව වවුචර් ඉදිරිපත් කිරීම, ගෙවීම් කටයුතු සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කිරීම.
26.	ආයතනික කටයුතුවලදී යහපත් මානව සම්බන්ධතා ගොඩනැගීම.	40	දින 01	20,000.00	දේශීය	නිලධාරීන්ට රාජකාරී කටයුතුවලදී යහපත් මානව සම්බන්ධතා ගොඩනගා ගැනීම පිළිබඳ අවබෝධයක් ලබා දීම තුළින් ඵලදායී රාජ්‍ය සේවයක් ඇති කිරීම.
27.	පුරාවිද්‍යා ස්ථානයක සැලසුම් ඇඳීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම	20	දින 01	19,150.00	දේශීය	නිවැරදිව පුරාවිද්‍යා ස්ථානයේ දළ සැලසුම් ඇඳීම, පුරාවිද්‍යා ස්ථානයක පරිමාණුකූල සැලසුම් ඇඳීම, සිතියම් ප්‍රක්ෂේපණය, පුරාවස්තු සැලසුම් ඇඳීම ආදී කටයුතු නිවැරදිව කිරීම සඳහා පුහුණුවක් ලබා දීම.

28.	කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන	25	දින 01	15,000.00	දේශීය	කාර්යාල ක්‍රම හා ගිණුම් ක්‍රම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම හා කාර්යක්ෂම ඵලදායී සේවාවක් ලබා දීම.
29.	කලාප පවත්වාගෙන යාම සහ පැනනගින ගැටළු අවම කර ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන	50	දින 01	19,606.00	දේශීය	කලාප කාර්යාලයන්හි නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය දැනුවත් කොට කලාප පවත්වාගෙන යාමේදී ඇති වන ගැටළු අවම කර ගැනීම.
30.	කාර්යාල කටයුතු හා ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ දැනුවත් කිරීම	35	දින 01	20,000.00	දේශීය	කාර්යාල කටයුතු සිදුකිරීමේ දී නිලධාරීන්ට අවශ්‍ය වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් ලබා දීම.
31.	ප්‍රාදේශීය කාර්යාල වලට අදාළ ගැටළු සාකච්ඡා කිරීම හා දැනුවත් කිරීමේ වැඩසටහන	40	දින 02	57,619.00	දේශීය	

* ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකවීම

ශාස්ත්‍රීය කටයුතු ඉටුකරන දෙපාර්තමේන්තුවක් වශයෙන් එම ශාස්ත්‍රීය දැනුම යාවත්කාලීන කිරීම අවශ්‍ය බැවින් දේශීය හා විදේශීය පුහුණු ලබා දීම අවශ්‍ය වේ. තවද කාර්ය පටිපාටික රීති, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි වැනි කාර්යාල ක්‍රමවේදයන් පිළිබඳව ද, සේවක දැනුම අල්ප බැවින් ඒ සම්බන්ධව ද පුහුණුව ලබාදිය යුතුව ඇත. රජකාරී කාර්යක්ෂමතාවය වර්ධනය සඳහා ආකල්පමය වෙනසක් නිරන්තරයෙන් ගොඩනැගිය යුතු බැවින් ආකල්ප සංවර්ධනාත්මක වැඩසටහන් ද, ඵලදායී විෂය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් සිදු කළ යුතුය.

7.පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6.	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.5.	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල නොවේ		2023 වර්ෂයේදී නිලධාරීන් දැනුවත් කර ඇත.
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GA - N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	-		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)**			
3.1.	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම.	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම.	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම.	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම.**			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
4.4.	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
4.5.	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම.	අනුකූල නොවේ		නිලධාරීන් දැනුවත් කර ඇත.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
6	**අභ්‍යන්තර විගණනය**			
6.1.	මු.රෙ. 134(2) DMA/1 - 2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූල වේ		
6.2.	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම.	අනුකූල නොවේ	ප්‍රාදේශීය කාර්යාල මඟින් තොරතුරු ලබා ගෙන පිළිතුරු ලබා දිය යුතු වාර්තා සඳහා ප්‍රමාද වී පිළිතුරු සපයා ඇත.	
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
6.4.	මුදල් රෙගුලාසි 134(4) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1.	DMA චක්‍රලේඛ 1 - 2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ (2022 වසර සඳහා රැස්වීම් 3 ක් පවත්වා ඇත)	4 වන රැස්වීම පැවැත්වීමට සැලසුම් කර තිබූ දිනයේදී අමාත්‍යාංශ රැස්වීමද යෙදී තිබුන බැවින් පැවැත්වීමට නොහැකි විය.	අමාත්‍යාංශ රැස්වීම පවත්වන දිනය පිළිබඳ සෙයා බලා වෙනත් දිනයක රැස්වීම පැවැත් වීමට කටයුතු කිරීම.
8	**වත්කම් කළමනාකරණය**			
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙක් පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම.	අනුකූල නොවේ		ඉදිරියේදී නිවැරදි කිරීමට උපදෙස් දී ඇත.
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල නොවේ		ඉදිරියේදී නිවැරදි කිරීමට උපදෙස් දී ඇත.
9	**වාහන කළමනාකරණය**			
9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2.	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ	2020/2021 වර්ෂයන් වල පැවති කොවිඩ් වසංගතය හා ඉන්ධන අර්බුදය හේතුවෙන් ඇතැම් වාහන සඳහා වසරකට දෙවතාවක් ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට ප්‍රායෝගිකව අපහසු වූ අතර මේ වන විට 2023 වර්ෂය සඳහා එම කාර්ය නියමිත පරිදි සිදු කිරීමට සැලසුම් කර ඇත.	2023 වර්ෂය සඳහා 2023.03.31 දිනට පෙර සහ 2023.08.31 දිනට පෙර ලෙස අවශ්‍ය දෙකකදී සියලු රථ වාහන සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට සැලසුම් කර ඇත.
9.6.	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		2022 අගෝස්තු මස සිට දෙසැම්බර් දක්වා නියමිත දිනට ඉදිරිපත් කර ඇත.
10.2.	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ	කෙසේ වුවද 2022 දෙසැම්බර් මසදී නිරවුල කර ඇත.	මාසිකව පසුවිපරම් ක්‍රියාවලිය අරඹා ඇත.
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2.	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදන උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1.	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2.	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ		කමිටුවක් පත් කිරීම තුළින් අයකර ගැනීම් ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල නොවේ		නිරවුල් කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.
13.2.	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1.	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2.	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල නොවේ		2023 වර්ෂයේ සිට පසුවිපරම් ක්‍රියාවලිය තුළින් මසක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු ආරම්භ කර ඇත
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1.	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	-		
15.2.	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	-		
15.3.	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	-		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුල කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2.	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3.	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1.	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3.	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1.	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2.	එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියා මාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල නොවේ	පවතින ප්‍රතිපාදන ප්‍රමාණයන් පිළිබඳව සැලකීමේදී පුහුණු අවස්ථා සෑම නිලධාරියෙකුම ආවරණය වන පරිදි සකස් කිරීම දුෂ්කර වීම. විවිධ ක්ෂේත්‍රයන් යටතේ විශේෂිකරණය වූ විවිධ තනතුරු දරන නිලධාරීන්ගෙන් සමන්විත කර්යමණ්ඩලයක් සිටීම.	දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විවිධ අංශ යටතේ පුහුණු කිරීමේ අවශ්‍යතාවය පවතින බැවින් ඔවුන් සියල්ලම ආවරණය වන පරිදි පුහුණු වැඩ සටහන් සකස් කිරීමට පියවර ගැනිම.
19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	අනුකූල වේ		
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5. ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම.**			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	අනුකූල වේ		